මධුර දේශනා 100

The cooperative Office for Call & Guidance and Edification of Expatriates in North Riyadh
Tel.: 4704466 - 4705222

مائة سنة ثابتة

أعده ترجمه للغة السنهالية :

شعبة توعية الجاليات في الزلفي

الطبعة الأولى : ١٤٢٥/٢ هـ.

ⓒ شعبة توعية الجاليات بالزلفي، ١٤٢٥هـ

فهرسة مكتبة الملك فهد الوطنية أثناء النشر

شعبة توعية الجاليات بالزلفي
مائة سنة ثابتة – الزلفي ، ١٤٢٥ هـ
٥٦ ص؛ ١٢ × ١٧ سم
ردمك : ٥٧- ٨٦٤-٩٩٦٠
(النص باللغة السنهالية)
١-الأدعية والأوراد أ. العنوان
ديوي ٢١٢,٩٣ ١٤٢٥/٧٢٥

رقم الإيداع : ١٤٢٥/٧٢٥
ردمك : ٥٧ – ٨٦٤–٩٩٦٠

الصف والإخراج: شعبة توعية الجاليات في الزلفي

١٠٠ سنة ثابتة
නබිතුමාගේ මදුර දේශනා 100

අල්ලාහ් පවසන බව නබි මුහම්මදු (සල්) තුමා දැසූ වදනක් අබූහුරෛරා (රලි) තුමා මෙසේ හෙළි කරන්නේය.

عن أبي هريرة ﷺ قال: قال رسول الله ﷺ: ((إنَّ اللهَ تَعَالَى قَالَ: مَنْ عَادَى لِيْ وَلِيًا فَقَدْ آذَنْتُهُ بِالْحَرْبِ، وَمَا تَقَرَّبَ إِلَيَّ عَبْدِيْ بِشَيْءٍ أَحَبُّ إِلَيَّ مِمَّا افْتَرَضْتُهُ عَلَيْهِ ، وَمَا زَالَ عَبْدِيْ يَتَقَرَّبُ إِلَيَّ بِالنَّوَافِلِ حَتَّى أُحِبَّهُ ، فَإِذَا أَحْبَبْتُهُ: كُنْتُ سَمْعَهُ الَّذِيْ يَسْمَعُ بِهِ، وَبَصَرَهُ الَّذِيْ يُبْصِرُ بِهِ، وَيَدَهُ الَّتِيْ يَبْطِشُ بِهَا ، وَرِجْلَهُ الَّتِيْ يَمْشِيْ بِهَا ، وَإِنْ سَأَلَنِيْ لَأُعْطِيَنَّهُ ، وَلَئِن اسْتَعَاذَنِيْ لَأُعِيْذَنَّهُ ، وَمَا تَرَدَّدْتُ فِيْ شَيْءٍ أَنَا فَاعِلُهُ تَرَدُّدِيْ عَنْ نَفْسِ الْمُؤْمِنِ ، يَكْرَهُ الْمَوْتَ وَأَنَا أَكْرَهُ مُسَاءَتَهُ)) [رواه البخاري]

කවරෙක් මාගේ හිතවතෙකුට හතුරුකම් කරන්නේද, ඔහුට එරෙහිව මා යුධ ප්‍රකාශය කරමි. මා අනිවාර්ය කළ කාර්ය මගින් හැර මාහට කැමැති කිසියම් දෙයකින් මා කරා ලඟාවීමට මාගේ වහළාට නොහැක. මාගේ වහළා මා ප්‍රියවන තෙක් කාලීන ක්‍රියාවන් මගින් මා කරා ලඟාවෙමින් සිටී. එසේ මා ඔහු ප්‍රිය කළේනම්, ඔහු සවන් දෙන කණ් වශයෙන්ද, ඔහු බලන නැත් වශයෙන්ද, ඔහු අල්ලන අත් වශයෙන්ද ඔහු ඇවිදින කකුල් වශයෙන්ද මා පත්වෙමි. ඔහු මාගෙන් දෙයක් අයැද සිටියේනම්, එය මා ඔහුට ලබා දෙමි. ඔහු මාගෙන් රැකවරණය පැතුවේනම්, එය ඔහුට මා ලබා දෙමි. විශ්වාස වන්තයෙකුගේ ප්‍රාණය අත්පත් කරන

කළ මා ලක්වන වෙහෙස සේ මා කරන වෙනත් කිසියම් කාර්යයකින් හෝ වෙහෙසට නොපත්වෙමි. ඔහු මරණය අප්‍රිය කරයි. මා ඔහුට වේදනා කිරීම අප්‍රිය කරමි. (බුහාරි)

නින්දයෙහි පිළිවෙල

1-නිදා ගැනීමට පෙර දෝවනය කර ගැනීම :

නබිනායක මුහම්මදු (සල්) තුමා ඉර්රාඋ බින් ආසිබ් (රලි) තුමා අමතා මෙසේ පැවැසීය.

قال النبي ﷺ للبراء بن عازب ﷺ ((إِذَا أَتَيْتَ مَضْجَعَكَ ، فَتَوَضَّأْ وُضُوْءَكَ لِلصَّلاَةِ ، ثُمَّ اضْطَجِعْ عَلَى شِقِّكَ الْأَيْمَنِ..)) [متفق عليه]

ඔබ නිදාගැනීමට අදහස් කරන කළ සලාතයට කරන සේ දෝවනය කර ගන්න. පසුව, දකුණු පසට හැරී නිදා ගන්න. (බුහාරි හා මුස්ලිම්)

2-නිදා ගැනීමට පෙර සූරා ඉහ්ලාස්, ෆලක් හා නාස් පාරායනා කිරීම :

ආයිෂා (රලි) තුමිය මෙසේ වාර්තා කරන්නීය.

عن عائشة رضي الله عنها ، أَنَّ النَّبِيَّ ﷺ كَانَ إِذَا أَوَى إِلَى فِرَاشِهِ كُلَّ لَيْلَـةٍ جَمَعَ كَفَّيْهِ ثُمَّ نَفَثَ فِيهِمَا، فَقَرَأَ فِيهِمَا: ((قُلْ هُوَ اللهُ أَحَدٌ)) وَ ((قُلْ أَعُوْذُ بِـرَبِّ الْفَلَقِ)) وَ ((قُلْ أَعُوْذُ بِرَبِّ النَّاسِ))، ثُمَّ يَمْسَحُ بِهِمَا مَا اسْتَطَاعَ مِنْ جَسَدِهِ، يَبْدَأُ بِهِمَا عَلَى رَأْسِهِ وَوَجْهِهِ، وَمَا أَقْبَلَ مِنْ جَسَدِهِ ، يَفْعَلُ ذَلِكَ ثَـلاَثَ مَـرَّاتٍ. [رواه البخاري]

නබි මුහම්මදු (සල්) තුමා රාත්‍රී නිදා ගැනීමට අදහස් කරන කළ, සිය දෑත එකතුකොට එහි පිඹින්නේය. පසුව කුල්හුවල්ලාහු අහද්, කුල් අඌදු බිරබ්බිල් ෆලක් හා කුල් අඌදු බිරබ්බින් නාස් යන පරිච්ඡේදයන් පාරායනා කර, එම අත්ල දෙකින් සිය මුහුණ හා හිසෙන් ආරම්භකොට හැකිතාක් තම ශරීරය පුරාම පිරිමදින්නේය. මෙසේ එතුමා තෙවරක් කරන්නේය. (බුහාරි)

3-සිහින දකින කළ තක්බීර් හා තස්බීහ් උසුරීම :

අලී (රලි) තුමා මෙසේ වාර්තා කරන්නේය.

عن علي ﷺ، أَنَّ رَسُوْلَ الله ﷺ قَالَ حِيْنَ طَلَبَتْ مِنْهُ فَاطِمَةُ رَضِيَ اللهُ عَنْهَا خَادِمًا: ((أَلاَ أَدُلُّكُمَا عَلَى مَا هُوَ خَيْرٌ لَكُمَا مِنْ خَادِمٍ ؟ إِذَا أَوَيْتُمَا إِلَى فِرَاشِكُمَا، أَوْ أَخَذْتُمَا مَضَاجِعَكُمَا، فَكَبِّرَا أَرْبَعًا وَثَلاَثِيْنَ، وَسَبِّحَا ثَلاَثًا وَثَلاَثِيْنَ، وَاحْمَدَا ثَلاَثًا وَثَلاَثِيْنَ. فَهَذَا خَيْرٌ لَكُمَا مِنْ خَادِمٍ)) [متفق عليه]

ෆාතිමා (රලි) තුමිය තමාට මෙහකාරයෙක් ලබා දෙන මෙන් නබි මුහම්මදු (සල්) තුමාගෙන් විමසූ කළ එතුමා 'මෙහකාරයෙකුට වඩා උතුම් දෙයක් ඔබලා (ෆාතිමා හා අලි) දෙදෙනාට මා කියා දෙන්නද ? ඔබලා දෙදෙනා නිදා ගැනීමට අදහස් කළ විට සුබ්හානල්ලාහ් 33 වරක්ද, අල් හම්දු ලිල්ලාහ් 33 වරක්ද, අල්ලාහු අක්බර් 34 වරක්ද උසුරන්න. මෙය ඔබලාට මෙහකාරයෙකුට වඩා උතුම්ය' යනුවෙන් පැවැසීය. (බුහාරි හා මුස්ලිම්)

4-නින්දෙන් සිට හදිසියෙන් අවදිවූ කළ කරන ප්‍රාර්ථනාව :

නබි මුහම්මදු (සල්) තුමා දැසූ බව උබාදා බින් සාමිත් (රලි) තුමා මෙසේ වාර්තා කරන්නේය.

عن عبادة بن الصامت، عن النبي ﷺ قال: ((مَنْ تَعَارَّ مِنَ اللَّيْلِ فَقَالَ: لاَ إِلَهَ إِلاَّ اللهُ وَحْدَهُ لاَ شَرِيْكَ لَهُ ، لَهُ الْمُلْكُ وَلَهُ الْحَمْدُ، وَهُوَ عَلَى كُلِّ شَيْءٍ قَدِيْرٌ، اَلْحَمْدُ للهِ، وَسُبْحَانَ اللهِ، وَاللهُ أَكْبَرُ، وَلاَ حَوْلَ وَلاَ قُوَّةَ إِلاَّ بِاللهِ، ثُمَّ قَالَ: اَللَّهُمَّ اغْفِرْ لِيْ، أَوْ دَعَا، اُسْتُجِيْبَ لَهُ ، فَإِنْ تَوَضَّأَ وَصَلَّى قُبِلَتْ صَلاَتُهُ)) [رواه البخاري]

කවරෙක් රාත්‍රියෙහි නින්දෙන් සිට හදිසියෙන් අවදිව සිට 'වන්දනාමානයට සුදුසු ස්වාමියා අල්ලාහ් හැර අන් කව රෙක් හෝ නොමැත. ඔහු කේවලය. ඔහුට සමානව කිසි වක් හෝ නැත. සියළු ප්‍රශංසා හා පාලන බලය ඔහුටම හිමිවේ. ඔහු සැම දේ කෙරෙහි සර්ව බලවතාය. ප්‍රශංසා සියල්ල අල්ලාහ්ටම හිමිය. ඔහු පවිත්‍ර වන්තයාය. වන්දනා මානයට සුදුස්සා ඔහු හැර අන් කවරෙක් හෝ නැත. ඔහු අති ශ්‍රේෂ්ඨය. කුසලක් කිරීම හෝ අකුසලින් වැළකී සිටීම ඔහු මගින්ම පවතී' යනුවෙන් පවසා 'ස්වාමිනී, මාහට කමා කරන්න' යනුවෙන් හෝ වෙනත් ප්‍රාර්ථනාවක් හෝ කළේ නම්, එය පිළිගනු ලැබේ. දෝවනය කොට සලාතය ඉටු කළේනම්, එය පිළිගනු ලැබේ. (බුහාරි)

5-නින්දෙන් අවදිවූ පසු :

හුදෛෆා ඉබ්නු අල් යමානි (රලි) තුමා මෙසේ වාර්තා කරන්නේය.

عن حذيفة بن اليمان ﷺ قال: كَانَ النَّبِيُّ ﷺ وَإِذَا اسْتَيْقَظَ قَالَ: ((اَلْحَمْدُ لله الَّذِيْ أَحْيَانَا بَعْدَمَا أَمَاتَنَا، وَإِلَيْهِ النُّشُوْرُ)) [رواه البخاري]

නබි මුහම්මදු (සල්) තුමා නින්දෙන් අවදිවූ කළ 'අල් හම්දු ලිල්ලාහිල්ලදී අහ්යානා බඃදමා අමාතනා වඉලෛහින් නුෂූර්' යනුවෙන් උසුරන්නේය. (බුහාරි)

දෝවනය හා සලාතයෙහි පිළිවෙල

6-කට හා නාසය එකවරම සේදීම :

අබ්දුල්ලාහ් ඉබ්නු සෙයිද් (රලි) තුමා මෙලෙස වාර්තා කරන්නේය.

عن عبدالله بن زيد ﷺ، أَنَّ رَسُوْلَ اللهِ ﷺ: ((تَمَضْمَضَ، وَاسْتَنْشَقَ مِنْ كَفٍّ وَاحِدَةٍ)) [رواه مسلم]

නබි මුහම්මදු (සල්) තුමා එක අතකින් ගත් ජලයෙන් කට හා නාසය සෝදන්නේය. (මුස්ලිම්)

7-ස්නානය කිරීමට පෙර දෝවනය කිරීම :

ආයිෂා (රලි) තුමිය මෙසේ වාර්තා කරන්නකීය.

عن عائشة رضي الله عنها، أنَّ النبي ﷺ : ((كَانَ إِذَا اغْتَسَلَ مِنَ الْجَنَابَة ، بَـــدَأَ فَغَسَلَ يَدَيْه ، ثُمَّ تَوَضَّأَ كَمَا يَتَوَضَّأُ لِلصَّلَاة ، ثُمَّ يُدْخِلُ أَصَابِعَهُ فِي الْمَاء ، فَيُخَلِّلُ بِهَا أُصُـــوْلَ الشَّعْرِ، ثُمَّ يَصُبُّ عَلَى رَأْسِه ثَلَاثَ غُرَف بِيَدَيْه، ثُمَّ يُفِيْضُ الْمَاءَ عَلَى جِلْده كُلِّه)) [البخاري]

නබි මුහම්මදු (සල්) තුමා අනිවාර්ය ස්නානය කරන කළ පළමුවෙන් සිය බාහු දෙක සෝදන්නේය. පසුව, සලා තයට කරන සේ දෝවනය කරන්නේය. පසුව ඇඟිලි ජලයේ

ඔබා හිසෙහි පහළ පෙදෙස පිරිමදින්නේය. පසුව නැවතත් දැතින් ජලය අහුරා සිය හිසෙහි වක්කරන්නේය. පසුව, තම මුළු ශරීරයේම ජලය වක්කරන්නේය. (මුස්ලිම්)

8-දෝවනය කළ පසු සඟාදා උසුරීම :

නබි මුහම්මදු (සල්) තුමා පැවසූ බව උමර් බින් කත්තාබ් (රලි) තුමා මෙසේ වාර්තා කරන්නේය.

عن عمر بن الخطاب ﷺ قال: قال رسول الله ﷺ: ((مَا مِنْكُمْ مِنْ أَحَدٍ يَتَوَضَّأُ فَيُسْبِغُ الْوُضُوءَ ثُمَّ يَقُولُ : أَشْهَدُ أَنْ لاَ إِلَهَ إِلاَّ اللهُ، وَأَنَّ مُحَمَّدًا عَبْدُهُ وَرَسُولُهُ إِلاَّ فُتِحَتْ لَهُ أَبْـوَابُ الْجَنَّةِ الثَّمَانِيَةِ ، يَدْخُلُ مِنْ أَيِّهَا شَاءَ)) [رواه مسلم]

ඔබලාගෙන් කවරෙක් හෝ දෝවනය කර, එය පරිපූර්ණව කර, පසුව 'අෂ්හදු අල්ලා ඉලාහ ඉල්ලල්ලාහු වඅෂ්හදු අන්න මුහම්මදන් අබ්දුහූ වරසූලුහු' යනුවෙන් උසුරියේනම් ඔහුට ස්වර්ග අටක දොරටු විවෘතවෙ. කැමැති දොරටුවකින් ඔහු එහි පිවිසේ. (මුස්ලිම්)

9-ජලය සුරක්ෂිතව පරිහරණය කිරීම :

අනස් (රලි) තුමා මෙසේ වාර්තා කරන්නේය.

عن أنس ﷺ قال: ((كَانَ النَّبِيُّ ﷺ يَغْتَسِلُ بِالصَّاعِ إِلَى خَمْسَةِ أَمْدَادٍ، وَيَتَوَضَّـأُ بِالْـمُدِّ)) [متفق عليه]

නබි (සල්) තුමා සාඋවක (මුද්දු සතරක්) සිට මුද්දු පහක ප්‍රමාණ ජලයෙන් ස්නානය කරන්නේය. මුද්දුවක ප්‍රමාණ ජලයෙන් දෝවනය කරන්නේය. (බුහාරි හා මුස්ලිම්)

(දැතින් අහුරන ප්‍රමාණයක් මුද්දු යනුවෙන් හැඳින්වෙ)

10-දෝවනය කළ පසු රකඅත් දෙකක් ඉටු කිරීම :

නබි මුහම්මදු (සල්) තුමා දැසූ බව උස්මාන් (රලි) තුමාගේ වහලෙක්වූ හුම්රාන් මෙසේ වාර්තා කරන්නේය.

عن حُمران مولى عثمان ﷺ قال النبي ﷺ: ((مَنْ تَوَضَّأَ نَحْوَ وُضُوئِي هَذَا ، ثُمَّ صَلَّى رَكْعَتَيْنِ لاَ يُحَدِّثُ فِيْهِمَا نَفْسَهُ، غُفِرَ لَهُ مَا تَقَدَّمَ مِنْ ذَنْبِه)) [متفق عليه]

කවරෙක් මා කරන මෙම දෝවනය සේ දෝවනය කර, පසුව කිසියම් දෙයක් ගැන හෝ හදවත යොමු නොකොට රකඅත් දෙකක සලාතයක් ඉටු කරන්නේද, ඔහු පෙර කළ (සුළු) පාපයන් කමා කරනු ලැබේ. (බුහාරි හා මුස්ලිම්)

11-අදානයට පිළිතුරු දී පසුව නබිතුමාට සලවාත් කීම :

නබි මුහම්මදු (සල්) තුමාගෙන් තමා සවන් දුන් බවට අබ්දුල්ලාහ් බින් උමර් (රලි) තුමා මෙසේ වාර්තා කරයි.

عن عبدالله بن عمرو رضي الله عنهما ، أنه سمع النبي ﷺ يقول: ((إِذَا سَمِعْتُمْ الْمُؤَذِّنَ فَقُوْلُوا مِثْلَ مَا يَقُوْلُ، ثُمَّ صَلُّوا عَلَيَّ، فَإِنَّهُ مَنْ صَلَّى عَلَيَّ صَلاَةً، صَلَّى اللهُ عَلَيْهِ بِهَا عَشْرًا ... الحديث)) [رواه مسلم]

ඔබලා (සලාතයට අඬගසන) මුඅද්දින් වරයාගේ අදානයට සවන් දෙන්නේ නම්, ඔහු පවසන සේම ඔබලාද පවසන්න. පසුව, මා කෙරෙහි සලවාත් කියන්න. මක්නිසාද, මාහට සලවාත් එකක් කියන්නාට අල්ලාහ් දස වතාවක් සලවාත් කියන්නේය. (මුස්ලිම්)

නබිතුමාට සලවාත් කියූ පසු පහත සඳහන් ප්‍රාර්ථනාව කරන්නාට එතුමාගේ නිර්දේශය ලැබෙන්නේය. (බුහාරි)

ثم يقول بعد الصلاة على النبي ﷺ:(اَللّهُمَّ رَبَّ هَذه الدَّعْوَة التَّامَّة ، وَالصَّلاَة الْقَائمَة ، آت مُحَمَّدًا الْوَسيْلَةَ وَالْفَضيْلَةَ ، وَابْعَثْهُ مَقَامًا مَحْمُوْدًا الَّذي وَعَدْتَّهُ) رواه البخاري. مَنْ قَالَ ذَلكَ حَلَّتْ لَهُ شَفَاعَةُ النَّبي ﷺ.

අල්ලාහුම්ම රබ්බ හාදිහිද් දඃවතිත් තාම්මා. වස්සලාතිල් කාඉමා. ආති මුහම්මදනිල් වසීලත වල් ෆළීලා. වබ්හස්හු මකාමන් මහ්මූදන් අල්ලදී වඅද්තා.

12-අධිකව දත් මැදීම :

නබි මුහම්මදු (සල්) තුමා ප්‍රකාශ කළ බව අබූහුරෛරා (රලි) තුමා මෙසේ වාර්තා කරන්නේය.

عن أبي هريرة ﷺ ، أن رسول الله ﷺ قال: ((لَوْلاَ أَنْ أَشُقَّ عَلَــى أُمَّتــيْ ، لأَمَرْتُهُمْ بِالسِّوَاك عنْدَ كُلِّ صَلاَة)) [متفق عليه]

මාගේ සමාජයට වෙහෙසක් නොවන්නේ නම්, සෑම සලාතයටම මිස්වාක් (දත් මැදීම්) කරන මෙන් අණකර ඇත්තෙමි. (බුහාරි හා මුස්ලිම්)

නින්දෙන් සිට අවදිවූ කළද, දෝවනය කරන කළද, මුඛයෙහි දුගඳ ඇති වන කළද, අල්කුර්ආනය පාරායනා කරන කළද, නිවසෙහි පිවිසෙන කළද දත් මැදීම නබිතුමාගේ මගකි.

13-අළුයමින් දේවස්ථානයට යාම :

නබි මුහම්මදු (සල්) තුමා ප්‍රකාශ කළ බව අබූහුරෛරා (රලි) තුමා මෙසේ වාර්තා කරන්නේය.

عن أبي هريرة ﷺ قال: قال رسول الله ﷺ : ((... وَلَوْ يَعْلَمُوْنَ مَــا فِــي التَّهْجِيْرِ (التَّبْكِيْرِ) لاَسْتَبَقُوْا إِلَيْهِ ... الحديث)) [متفق عليه]

.....මවුහු සලාතය (සඳහා දේවස්ථානය)ට කාලවේලාව ඇතිව යාමේ පවතින පින දැන සිටින්නේනම්, මවුහු එය පිණිස තරග කරනු ඇත. (බුහාරි හා මුස්ලිම්)

14-දේවස්ථානයට ඇවිදගෙන යාම :

අබූහුරෙයිරා (රලි) තුමා නබි වදනක් මෙලෙස වාර්තා කරන්නේය.

عن أبي هريرة ﷺ، أن رسول الله ﷺ قال: ((أَلاَ أَدُلُّكُمْ عَلَى مَا يَمْحُو اللهُ بِهِ الْخَطَايَا ، وَيرْفَعُ بِهِ الدَّرَجَات)) قَالُوا: بَلَى يَارَسُوْلَ اللهِ. قَالَ: ((إِسْبَاغُ الوُضُــوْءِ عَلَى الْمَكَارِهِ، وَكَثْرَةُ الْخُطَا إِلَى الْمَسَاجِدِ، وَانْتِظَارُ الصَّلاَةِ بَعْدَ الصَّــلاَةِ، فَــذَلِكُمُ الرِّبَاطُ)) [رواه مسلم]

නබි මුහම්මදු (සල්) තුමා 'ඔබලාගේ පාපයන් කමා කොට ඔබලාගේ තරාතිරම උසස්කරන දෙයක් මා ඔබලාට පහදා දෙන්න දැයි?' විමසූ කළ එතුමාගේ අනුගාමිකයින් 'අල්ලාහ්ගේ දූතයාණෙනි, පහදා දෙන්න' යැයි කීහ. එවිට එතුමා 'ඒවා වෙහෙසට පත්වන අවස්ථාවල පවා දෝවනය පරිපූර්ණව කිරීම, අධිකව අඩි තබා දේවස්ථානයට යාම හා සලාතයක් ඉටුකළ පසු තවත් සලාතයක් අපේක්ෂා කිරීම වේ. එහෙයින්, මහත් සටන මෙයමය' යනුවෙන් පැවැසීය. (මුස්ලිම්)

15-සලාතයට සැනසීමෙන් හා බැගෑපත්කමින් යාම :

නබි මුහම්මදු (සල්) තුමාගෙන් තමා සවන් දුන් බව අබූහුරෙයිරා (රලි) තුමා මෙසේ වාර්තා කරන්නේය.

عن أبي هريرة ﷺ قال: سمعت رسول الله ﷺ يقول: ((إِذَا أُقِيْمَتِ الصَّلاَةُ فَلاَ تَأْتُوْهَا تَسْعَوْنَ، وَأْتُوْهَا تَمْشُوْنَ، وَعَلَيْكُمُ السَّكِيْنَةُ، فَمَا أَدْرَكْتُمْ فَصَلُّوا ، وَمَا فَاتَكُمْ فَأَتِمُّوْا)) [متفق عليه]

සලාතය (ආරම්භ කිරීම) සඳහා ඉකාමතය (කැඳවීම) කරනු ලැබුවෙනම්, දිවගෙන නොපැමිණෙන්න. (නිදහසේ) ඇවිදගෙන පැමිණෙන්න. සැනසුම අනුගමනය කරන්න. ලැබූ කොටස ඉටු කරන්න. නොලැබූ කොටස සම්පූර්ණ කරන්න. (බුහාරි හා මුස්ලිම්)

16-දේවස්ථානයට පිවිසන හා එයින් පිටවන කළ :

නබි මුහම්මදු (සල්) තුමා පැවැසූ වදනක් අබූ හුමයිදිස් සාඉදී (රලි) තුමා හෝ අබූ උසෙයිද් (රලි) තුමා මෙලෙස වාර්තා කරන්නේය.

عن أبي حُميد الساعدي ، أو عن أبي أُسيد رضي الله عنهما قال: قال رسول الله ﷺ: ((إِذَا دَخَلَ أَحَدُكُمْ الْمَسْجِدَ فَلْيَقُلْ: اَللّٰهُمَّ افْتَحْ لِيْ أَبْوَابَ رَحْمَتِكَ، وَإِذَا خَرَجَ فَلْيَقُلْ: اَللّٰهُمَّ إِنِّي أَسْأَلُكَ مِنْ فَضْلِكَ)) [رواه مسلم]

ඔබලාගෙන් කවරෙක් හෝ දේවස්ථානය තුල පිවිසන කළ 'අල්ලාහුම් මෆ්තහ්ලී අබ්වාබ රහ්මතික' යනුවෙන්ද, දේවස්ථානයෙන් පිටවන කළ 'අල්ලාහුම්ම ඉන්නී අස්අලුක මින් ෆළ්ලික' යනුවෙන්ද කියන්න. (මුස්ලිම්)

17-ආවරණයක් අභිමුඛව සලාතය ඉටු කිරීම :

නබි මුහම්මදු (සල්) තුමා පැවැසූ වදනක් මූසා බින් තල්හා (රලි) තුමා මෙසේ වාර්තා කරන්නේය.

عن موسى بن طلحة عن أبيه ﷺ قال: قال رسـول الله ﷺ: ((إِذَا وَضَعَ أَحَدُكُمْ بَيْنَ يَدَيْهِ مِثْلَ مُؤَخَّرَةِ الرَّحْلِ فَلْيُصَلِّ، وَلاَ يُبَالِ مَنْ مَرَّ وَرَاءَ ذَلِكَ)) [مسلم]

ඔබලාගෙන් කවරෙක් හෝ තම ඉදිරියෙහි (මුඅක්හිර තිර් රහ්ල්) රියන් තුනෙන් දෙකක ප්‍රමාණ උසැති දෙයක් තබා සලාතය ඉටු කළේ නම්, එයට පිටින් ඇවිදින්නන් ගැන නොසළකන්න. (මුස්ලිම්)

සලාතය ඉටු කරන්නා බිත්තියක හෝ කුළුණුවක හෝ මෙවන් දෙයක පිටුපසින් සිට හෝ සලාතය ඉටුකිරීම නබිතුමාගේ මගකි.

18-සජදා දෙක අතර ඉක්ආඋ ක්‍රමයට වාඩිවීම :

තාවූස් (රලි) තුමාගෙන් සවන් දුන් බව අබූ සුබෛර් (රලි) තුමා මෙසේ වාර්තා කරන්නේය.

عن أبي الزبير أنه سمع طاوسا يقول: قلنا لابن عباس ﷺ فِي الإِقْعَاءِ عَلَى الْقَدَمَيْنِ، فَقَالَ : ((هِيَ السُّنَّةُ))، فَقُلْنَا لَهُ: إِنَّا لَنَرَاهُ جَفَاءً بِالرَّجُلِ، فَقَالَ ابْنُ عَبَّاسٍ: ((بَلْ هِيَ سُنَّةُ نَبِيِّكَ ﷺ)) [رواه مسلم]

අපි ඉබ්නු අබ්බාස් (රලි) තුමාගෙන් (සලාතයේ) ඉක් ආඋ ක්‍රමයට හිඳගැනීම පිළිබඳව විමසීමු. එයට එතුමා 'එය නබිතුමාගේ මාර්ගයෙකි' යනුවෙන් පැවැසීය. එවිට අපි 'එය මිනිසුන්ට වෙහෙසක් බව පෙනෙන්නේය' යැයි කීමු. එයට

එතුමා 'නමුත්, එය ඔබලාගේ මුහම්මදු නබිතුමාගේ මාර්ගයෙකි' යනුවෙන් පැවැසීය. (මුස්ලිම්)

දෙපා සිටවා විළුඹ දෙක මත හිඳගැනීම ඉක්ආඋ යනුවෙන් හැඳින්වේ. සලාතයෙහි සජ්දා දෙක අතර මෙසේ හිඳගත යුතුයි.

19-සලාතයෙහි තවර්රුක් ක්‍රමයට හිඳගැනීම :

අබූ හුමයිද් අස්සාඉදී (රලි) මෙසේ වාර්තා කරන්නේය.

عن أبي حميد الساعدي ﷺ قال: ((كَانَ رَسُوْلُ اللهِ ﷺ إِذَا جَلَسَ فِي الرَّكْعَةِ الْآخِرَةِ ، قَدَّمَ رِجْلَهُ الْيُسْرَى ، وَنَصَبَ الْأُخْرَى ، وَقَعَدَ عَلَى مَقْعَدَتِهِ)) [رواه البخاري]

නබි මුහම්මදු (සල්) තුමා අවසාන රකඅතේ හිඳගන්නා කළ තම වම් පාදය (දකුණු දෙසට) ගෙන්වා, දකුණු කකුල සිටවා තමාගේ තට්ටම පොළොව මත ගැවෙන සේ අසුන් ගන්නේය. (බුහාරි)

20-සලාමය කීමට පෙර අධිකව ප්‍රාර්ථනා කිරීම :

අබ්දුල්ලාහ් බින් උමර් (රලි) මෙසේ වාර්තා කරන්නේය.

عن عبدالله بن عمر رضي الله عنهما قال: ((كُنَّا إِذَا كُنَّا مَعَ النَّبِي ﷺ ،إِلَى أَنْ قَالَ: ثُمَّ يَتَخَيَّرُ مِنَ الدُّعَاءِ أَعْجَبَهُ إِلَيْهِ فَيَدْعُو)) [رواه البخاري]

අපි නබි මුහම්මදු (සල්) තුමා සමග සලාතය ඉටුකරන කළ ... එතුමා ... 'පසුව ඔබලාගේ මනාපය පරිදි ප්‍රාර්ථනා වන් තෝරාගෙන ප්‍රාර්ථනා කරන්න' යනුවෙන් පැවැසීය. (බුහාරි)

21-පස්වේල සලාත්වලට පෙර හා පසු ඉටු කළ යුතු කාලීන සලාතයන් :

නබි මුහම්මදු (සල්) තුමාගෙන් තමා සවන් දුන් බව උම්මු හබීබා (රලි) තුමිය මෙසේ වාර්තා කරන්නීය.

عن أم حبيبة رضي الله عنها ، أنها سمعت رسول الله ﷺ يقول:((مَا مِنْ عَبْدٍ مُسْلِمٍ يُصَلِّي لِلهِ كُلَّ يَوْمٍ ثِنْتَيْ عَشَرَةَ رَكْعَةً تَطَوُّعًا غَيْرَ الْفَرِيْضَةِ، إِلاَّ بَنَى اللهُ لَهُ بَيْتًا فِي الْجَنَّةِ)) [رواه مسلم]

කවර මුස්ලිම් වරයෙක් හෝ දිනපතා අනිවාර්ය සලාත් වලට අමතරව උපරි සලාත් රකඅත් දොළහක් ඉටු කරන්නේද, අල්ලාහ් ඔහු වෙනුවෙන් ස්වර්ගයෙහි නිවසක් ඉදි කරයි. (මුස්ලිම්)

දිනපතා ඉටුකළ යුතු එම උපරි සලාතයන් දොළහකි. ඒවා ලුහර් සලාතයට පෙර සතරක්ද, පසුව දෙකක්ද, මග්-රිබ් සලාතයට පසු දෙකක්ද, ඉෂා සලාතයට පසු දෙකක්ද හා ෆජ්ර් සලාතයට පෙර දෙකක්ද වේ.

22-ලුහා සලාතය :

නබි මුහම්මදු (සල්) තුමා පැවැසූ බව අබූදර් (රලි) තුමා මෙසේ වාර්තා කරන්නේය.

عن أبي ذر ﷺ ، عن النبي ﷺ أنه قال: ((يُصْبِحُ عَلَى كُلِّ سُلاَمَى (أي: مفصل) مِنْ أَحَدِكُمْ صَدَقَةٌ ، فَكُلُّ تَسْبِيْحَةٍ صَدَقَةٌ ، وَكُلُّ تَحْمِيْدَةٍ صَدَقَةٌ، وَكُلُّ تَهْلِيْلَةٍ صَدَقَةٌ، وَكُلُّ تَكْبِيْرَةٍ صَدَقَةٌ، وَأَمْرٌ بِالْمَعْرُوْفِ صَدَقَةٌ، وَنَهْيٌ عَنِ الْمُنْكَرِ صَدَقَةٌ، وَيُجْزِىءُ مِنْ ذَلِكَ رَكْعَتَانِ يَرْكَعُهُمَا مِنَ الضُّحَى)) [رواه مسلم]

ඔබලාගෙන් කෙනෙකුගේ සෑම පුරුක සඳහාද සදකා වක්වෙ. සුබ්හානල්ලාහ් යනුවෙන් කීම් සදකාවකි. අල්හම්දු ලිල්ලාහ් යනුවෙන් කීම සදකාවකි. ලාඉලාහ ඉල්ලල්ලාහ් යනුවෙන් කීම සදකාවකි. අල්ලාහු අක්බර් යනුවෙන් කීම සදකාවකි. කුසලක් අණ කිරීම සදකාවකි. අකුසලක් වැළ කීම සදකාවකි. ලුහා වේලාවෙහි රකඅත් දෙකක සලාතයක් ඉටුකිරීම මේවා සියල්ලට ප්‍රමාණවත්වෙ. (මුස්ලිම්)

දහවල උදාවී රශ්මිය අධිකවීම හා මෙම සලාතයෙහි වේලාව ආරම්භවන අතර, (ඉර මුදුනෙන් ඉවත්වීමෙන් පසු) ලුහර් සලාතයෙන් අවසන්වෙ. මෙයට සීමිත රකඅත් ගණ නක් නොමැති අතර අවම වශයෙන් රකඅත් දෙකක් හෝ ඉටුකළ යුතුයි.

23-රාත්‍රී නැමදුම :

අබූහුරෛරා (රලි) තුමා නබි වදනක් මෙසේ වාර්තා කරන්නේය.

عن أبي هريرة ﷺ، أَنَّ رَسُوْلَ اللهِ ﷺ سُـئِلَ : أَيُّ الصَّـلاَةِ أَفْضَـلُ بَعْـدَ الْمَكْتُوْبَةِ، فَقَالَ: ((أَفْضَلُ الصَّلاَةِ بَعْدَ الصَّلاَةِ الْمَكْتُوْبَةِ، الصَّلاَةُ فِيْ جَوْفِ اللَّيْلِ))

[رواه مسلم]

නබි මුහම්මදු (සල්) තුමාගෙන් 'අනිවාර්ය සලාතයෙන් පසු විශිෂ්ඨ සලාතය කුමක්දැ යි ? විමසූ කළ නබිතුමා 'අනිවාර්ය සලාතයෙන් පසු විශිෂ්ඨ සලාතය මැදියම් රැයේ කරන සලාතයකි' යනුවෙන් පැවැසීය. (මුස්ලිම්)

24-විත්ර් සලාතය :

ඉබ්නු උමර් (රලි) තුමා මෙසේ වාර්තා කරන්නේය.

عن ابن عمر رضي الله عنهما ، أنَّ النبي ﷺ قال : ((اجْعَلُوا آخِرَ صَلاَتِكُمْ بِاللَّيْلِ وِتْرًا)) [متفق عليه]

විත්ර් සලාතය රාත්‍රියෙහි අවසන් සලාතය බවට පත් කර ගන්න. (බුහාරි හා මුස්ලිම්)

25-පාවහන් සමග සලාතය ඉටු කිරීම :

අනස් බින් මාලික් (රලි) මෙසේ වාර්තා කරන්නේය.

سُئِل أنس بن مالك ﷺ: أَكَانَ النَّبِيُّ ﷺ يُصَلِّي فِي نَعْلَيْهِ؟ قَالَ: ((نَعَـمْ)) [رواه البخاري]

අනස් බින් මාලික් (රලි) තුමාගෙන් 'නබි මුහම්මදු (සල්) තුමා පාවහන් පැළඳගෙන සලාතය ඉටුකර ඇත්දැයි විමසූ කළ, එතුමා 'ඔව්' යනුවෙන් කීහ. (බුහාරි)

26-කුබා දේවස්ථානයෙහි සලාතය ඉටු කිරීම :

ඉබ්නු උමර් (රලි) තුමා මෙසේ වාර්තා කරන්නේය.

عن ابن عمر رضي الله عنهما قال: ((كَانَ النَّبِيُّ ﷺ يَأْتِي قُبَاءَ رَاكِبًا وَمَاشِيًا))

زاد ابن نمير: حدثنا عبيدالله، عن نافع: ((فَيُصَلِّي فِيْهِ رَكْعَتَيْنِ)) [متفق عليه]

නබි මුහම්මදු (සල්) තුමා කුබා දේවස්ථානයට පාගමනින් හා වාහනයෙන් පැමිණෙන්නේය. වෙනත් වාර්තාවක 'එ (කුබා)හි රකඅත් දෙකක සලාතයක් ඉටු කරන්නේය' යනුවෙන් සඳහන්වේ. (බුහාරි හා මුස්ලිම්)

27-නිවසෙහි කාලීන සලාතයන් ඉටු කිරීම :

නබි මුහම්මදු (සල්) තුමා පැවැසූ බවට ජාබිර් (රලි) තුමා මෙසේ වාර්තා කරන්නේය.

عن جابر ﷺ قال: قال رسول الله ﷺ : ((إِذَا قَضَى أَحَدُكُمُ الصَّلاَةَ فِي مَسْجِدِهِ فَلْيَجْعَلْ لِبَيْتِهِ نَصِيبًا مِنْ صَلاَتِهِ، فَإِنَّ اللهَ جَاعِلٌ فِيْ بَيْتِهِ مِنْ صَلاَتِهِ خَيْرًا)) [رواه مسلم]

ඔබලාගෙන් කවරෙක් හෝ දේවස්ථානයේ සලාතයක් ඉටු කරන්නේ නම්, ඔහුගේ සලාතයෙන් කොටසක් සිය නිවසෙහි ඉටු කිරීමටද වගබලා ගනිද්දෙන්. මක්නිසාදයත්, සැබැවින්ම, අල්ලාහ් ඔහුගේ නිවසෙහි කරන සලාතයටද කුසලක් ඇති කරන්නේය. (මුස්ලිම්)

28-ඉස්තිකාරා සලාතය :

(යහපතක් අපේක්ෂාකර කරන සලාතය)

ජාබිර් ඉබ්නු අබ්දුල්ලාහ් (රලි) තුමා මෙසේ වාර්තා කරන්නේය.

عن جابر بن عبدالله ﷺ قال: ((كَانَ رَسُوْلُ اللهِ ﷺ يُعَلِّمُنَا الإِسْتِخَارَةَ فِي الأُمُوْرِ كَمَا يُعَلِّمُنَا السُّوْرَةَ مِنَ الْقُرْآنِ)) [رواه البخاري]

නබි මුහම්මදු (සල්) තුමා අල්කුර්ආනයේ පරිච්ඡේදයන් අපට ඉගැන්වූ සේ, සෑම කාර්යයන්හි උතුම් දෙය තෝරා ගැනීමේ ක්‍රමයද ඉගැන්වූයේය. (බුහාරි)

පෙර සඳහන් පරිදි කෙනෙක් රකඅත් දෙකකින් සමන්විත සලාතයක් ඉටුකළ පසු, මෙසේ ප්‍රාර්ථනා කළ යුතුයි.

((اَللَّهُمَّ إِنِّي أَستَخيِرُكَ بعلمِكَ، وَأَستَقْدِرُكَ بِقُدرَتِكَ، وَأَسأَلُكَ مِنْ فَضْلِكَ الْعَظِيْمِ، فَإِنَّكَ تَقْدِرُ وَلاَ أَقْدِرُ ، وَتَعْلَمُ وَلاَ أَعْلَمُ ، وَأَنتَ عَلاَّمُ الْغُيُوبِ، اَللَّهُمَّ إِنْ كُنتَ تَعْلَمُ أَنَّ هَـــذَا الأَمْرَ (وَيُسَمِّي حَاجَتَهُ) خَيْرٌ لِي فِي دِيْنِي، وَمَعَاشِي، وَعَاقِبَةِ أَمْرِي ، فَاقْدُرْهُ لِي، وَيَسِّرْهُ لِـــي، ثُمَّ بَارِكْ لِي فِيْهِ، وَإِنْ كُنتَ تَعْلَمُ أَنَّ هَذَا الأَمْرَ شَرٌّ لِي فِي دِيْنِي، وَمَعَاشِي، وَعَاقِبَـــةِ أَمْـــرِي، فَاصْرِفْهُ عَنِّي، وَاصْرِفْنِي عَنْهُ، وَاقْدُرْ لِي الْخَيْرَ حَيْثُ كَانَ ثُمَّ أَرْضِنِي بِهِ))

අල්ලාහුම්ම ඉන්නී අස්තහීරුක බිඉල්මික, වඅස්තක්දිරුක බිකුද්රතික, වඅස්අලුක මින් ෆළ්ලිකල් අළීම්, ෆඉන්නක තක්දිරු වලා අක්දිරු, වතඃලමු වලා අඃලමු, වඅන්ත අල්ලාමුල් ගුයූබ්, අල්ලාහුම්ම ඉන් කුන්ත තඃලමු අන්න හාදල් අම්ර ක්හයිරුන්ලී ෆී දීනී, වමආෂී, වආකිබති අම්රී, ෆක්දුර්හු ලී, වයස්සිර්හු ලී, තුම්ම බාරික් ලී ෆීහි, ව ඉන් කුන්ත තඃලමු අන්න හාදල්අම්ර ෂර්රුන්ලී ෆී දීනී, වමආෂී, වආකිබති අම්රී, ෆස්රිෆ්හු අන්නී, වස්රිෆ්නී අන්හු, වක්දුර් ලී අල් ක්හයිර හයිසු කාන තුම්ම අර්ළීනී බිහි.

ස්වාමිනී, ඔබ සතුව ඥානය තිබෙන බැවින්, ඔබෙන් යහපත අයදිමි. ඔබ වෙත ශක්තිය තිබෙන බැවින් ඔබෙන් මා ශක්තිය අයදිමි. ඔබේ උතුම් දායාදය ඔබෙන් අයදිමි. ඔබ සැම දේ කෙරෙහි බලවතාය. මම (කිසියම් දෙයකට හෝ) බලවතෙක් නොවන්නෙමි. ඔබ සැම දේ දැන සිටින්නාය. මම කිසිවක් හෝ නොදැන සිටින්නාය. සැඟවුණු කරුණු (සියල්ල) දැන සිටින්නා ඔබමය.

ස්වාමිනී, මගේ මෙම කාර්ය මගේ දහමටද, මාගේ ජීවිතයටද හා මාගේ පරලොවටද හොඳක් බව ඔබ දැන සිටින්නේනම්, එයට අදාල ශක්තිය මට ලබා දෙනු මැනව. එය

මාහට සරලකොට පසුව එහි මබේ අභිවෘධිය ඇති කරනු මැනව.

ස්වාමිනී, මගේ මෙම කාර්ය මගේ දහමටද, මාගේ ජීවිතයටද හා මාගේ පරලොවටද සෙතක් නොවන බව ඔබ දැන සිටින්නේනම්, මාගෙන් මෙම කාර්යයද, මෙම කාර්යයෙන් මාවද ඉවත් කරනු මැනව. කුමන තැනක සිටියත්, මාහට හොඳ කාර්යයන් සඳහා ශක්තිය ලබා දෙනු මැනව. පසුව එහි මාහට තෘප්තිය ලබා දෙනු මැනව.

29-ෆජ්ර් සලාතයෙන් පසු ඉර උදාවන තෙක් එම ස්ථානයේ රැඳී සිටීම :

ජාබිර් ඉබ්නු සමුරා (රලි) තුමා නබි වදනක් මෙසේ වාර්තා කරන්නේය.

عن جابر بن سمرة ﷺ: (أَنَّ النَّبِيَّ ﷺ كَانَ إِذَا صَلَّى الْفَجْرَ جَلَسَ فِي مُصَلَّاهُ حَتَّى تَطْلُعَ الشَّمْسُ حَسَنًا) [رواه مسلم]

නබි මුහම්මදු (සල්) තුමා ෆජ්ර් සලාතය ඉටු කළේ නම්, ඉර පැහැදිලිව උදාවන තෙක් එම ස්ථානයෙහිම රැඳී සිටින්නේය. (මුස්ලිම්)

30-සිකුරාදා දින ස්නානය කිරීම :

නබිනායක මුහම්මදු (සල්) තුමා පැවැසූ බව ඉබ්නු උමර් (රලි) තුමා මෙසේ වාර්තා කරන්නේය.

عن ابن عمر رضي الله عنهما قال: قال رسول الله ﷺ: ((إِذَا جَاءَ أَحَـدُكُمُ الْجُمُعَةَ فَلْيَغْتَسِلْ)) [متفق عليه]

ඔබලාගෙන් කවරෙක් හෝ ජුම්ආවට පැමිණීමට අදහස් කරන්නේද, ඔහු ස්නානය කරන්වා. (බුහාරි හා මුස්ලිම්)

31-ජුම්ආ සලාතය සඳහා උදෑසනින් පිටවීම :

නබි මුහම්මිදු (සල්) තුමා ප්‍රකාශ කළ බව අබූහුරෛරා (රලි) තුමා මෙසේ වාර්තා කරන්නේය.

عن أبي هريرة ﷺ قال: قال رسول الله ﷺ: ((إِذَا كَانَ يَـوْمُ الْجُمُعَـةِ، وَقَفَـتِ الْمَلاَئِكَةُ عَلَى بَابِ الْمَسْجِدِ، يَكْتُبُونَ الْأَوَّلَ فَالْأَوَّلَ، وَمَثَلُ الْمُهَجِّرِ (أَي:الْمُبَكِّرِ) كَمَثَـلِ الَّذِي يُهْدِي بَدَنَةً، ثُمَّ كَالَّذِي يُهْدِي بَقَرَةً، ثُمَّ كَبْشاً، ثُمَّ دَجَاجَةً، ثُمَّ بَيْضَةً، فَإِذَا خَرَجَ الْإِمَامُ طَوَوا صُحُفَهُمْ، وَيَسْتَمِعُونَ الذِّكْرَ)) [متفق عليه]

සිකුරාදා දිනයේ සුරදූතයන් දේවස්ථානයේ පිවිසෙන දොරටුවෙහි සිටගෙන අනුපිළිවෙලින් පැමිණෙන්නන් සට හන් කරන්නෝය. ප්‍රථමයෙන් පැමිණෙන්නා ඔටුවෙක් කුර්බාන් කළ අයෙකු සේද, එයට පසු පැමිණෙන්නා ගවයෙක් කුර්බාන් කළ අයෙකු සේද, එයට පසු පැමිණෙන්නා බැටළු වක් එයට පසු කුකුළෙක් එයට පසු බිත්තරයක් යනාදි වශයෙන් කුර්බාන් කළ අයෙකු සේද සළකනු ලබන්නේය. ඉමාම්වරයා පැමිණ විගස සුර දූතයන් සිය සටහන් පත් අකුළා, දේශනාව සවන් දීමට පටන් ගනිති. (බුහාරි හා මුස්ලිම්)

32-ජුම්ආ දිනයෙහි ප්‍රාර්ථනාවන් පිළිගනු ලබන වේලාව සෙවීම :

අබූහුරෛරා (රලි) තුමා මෙසේ වාර්තා කරන්නේය.

عن أبي هريرة ﷺ ، أَنَّ رَسُوْلَ الله ﷺ ذَكَرَ يَوْمَ الْجُمُعَة فَقَالَ: ((فِيْه سَاعَةٌ، لاَ يُوَافقُهَا عَبْدٌ مُسْلمٌ، وَهُوَ قَائمٌ يُصَلِّي، يَسْأَلُ الله تَعَالى شَيْئًا، إِلاَّ أَعْطَاهُ إِيَّاهُ، وَأَشَارَ بيَده يُقَلِّلُهَا [متفق عليه]

නබි මුහම්මදු (සල්) තුමා ජුම්ආ දිනය ගැන සඳහන් කරන කළ 'ජුම්ආ දිනයෙහි එක් වෙලාවක් ඇත. එම වෙලාවෙහි මුස්ලිම්වරයෙක් සලාතයෙහි සිට අල්ලාහ්ගෙන් කුමක් හෝ අයදින්නේනම්, එය ඔහු ඔහුට නොදී නොසිටින්නේය යනුවෙන් පවසා, එය ඉතාමත් සුළු වෙලාවක් බව සිය අතින් සංඥාකර පෙන්නුවේය. (බුහාරි හා මුස්ලිම්)

33-අවුරුදු සලාතය සඳහා එක් මාර්ගයෙකින් යාම හා වෙනත් මාර්ගයකින් ඒම :

ජාබිර් (රලි) තුමා මෙසේ වාර්තා කරන්නේය.

عن جابرﷺ قال:((كَانَ النَّبِيُّ ﷺ إِذَا كَانَ يَوْمُ عيْد خَالَفَ الطَّرِيْقَ)) [البخاري]

අවුරුදු දිනය පැමිණි කළ නබි මුහම්මදු (සල්) තුමා (සලාතය සඳහා යාමට හා ඒමාට) අදාල මාර්ග වෙනස්කර ගන්නේය. (බුහාරි)

34-ජනාසා වෙනුවෙන් සලාතය ඉටු කිරීම :

නබි මුහම්මදු (සල්) තුමා පැවැසූ බව අබූහුරෙරා (රලි) තුමා මෙසේ වාර්තා කරන්නේය.

عن أبي هريرة ﷺ قال: قال رسول الله ﷺ : ((مَنْ شَهِدَ الْجَنَازَةَ حَتَّى يُصَلِّيَ عَلَيْهَا فَلَهُ قِيْرَاطٌ ، وَمَنْ شَهِدَهَا حَتَّى تُدْفَنَ فَلَهُ قِيْرَاطَانِ)) قِيْلَ: وَمَا الْقِيْرَاطَانِ؟ قَالَ: ((مِثْلَ الْجَبَلَيْنِ الْعَظِيْمَيْنِ)) [رواه مسلم]

මෘත දේහයක් වෙනුවෙන් ජනාසා සලාතය ඉටු කරන තෙක් එයට සහභාගිවන්නාට එක් කීරාතයක කුලියක්ද, එය භූමිදානය කරන තෙක් එයට සහභාගිවන්නාට කීරාත් දෙකක්ද ලැබෙන්නේය යනුවෙන් නබි මුහම්මදු (සල්) තුමා පැවැසූ කළ, 'කීරාත් දෙකක්' යනු කුමක්ද' යැයි නබිතුමා ගෙන් විමසූහ. එයට එතුමා 'එය විශාලමත් කඳු දෙකකට සමානවේ' යනුවෙන් පැවැසීය. (මුස්ලිම්)

35-මිනීවළවල් බැහ දැකීම :

නබි මුහම්මදු (සල්) තුමා පැවැසූ බව බුරෛදා (රලි) තුමා මෙසේ වාර්තා කරන්නේය.

عن بريدة ﷺ قال: قال رسول الله ﷺ : ((كُنْتُ نَهَيْتُكُمْ عَنْ زِيَارَةِ الْقُبُورِ فَزُوْرُوْهَا ...الحديث)) [رواه مسلم]

මිනීවළවල් බැහැ දැකීම මා (පෙර) තහනම් කළෙමි. (නමුත්, මින් ඉදිරියට) ඒවා බැහැ දකින්න.... (මුස්ලිම්)

නමුත්, ස්ත්‍රීන් මිනීවළවල් බැහැ දැකීම තහනම් බව ෂෙයික් බින් බාස් (රහ්) ඇතුළු විද්වතුන් තීන්දුකර ඇත.

උපවාසය පිළිබඳ පිළිවෙල

36-සහර් කිරීම :

නබි මුහම්මදු (සල්) තුමා පැවැසූ බව අනස් (රලි) තුමා මෙසේ වාර්තා කරන්නේය.

عن أنس ﷺ قال : قال رسول الله ﷺ : ((تَسَحَّرُوْا؛ فَإِنَّ فِي السُّحُوْرِ بَرَكَةً))

[متفق عليه]

(උපවාසයෙහි යෙදීම සඳහා) ඔබලා සහර් (අළුයමේ ආහාර පාන අනුභව) කරන්න. සැබැවින්ම සහර් කිරීමෙහි (අල්ලාහ්ගේ) අභිවෘධිය ඇත්තේය. (බුහාරි හා මුස්ලිම්)

37-ඉර බැසීම ස්ථිරවූ කළ උපවාසයෙන් මිදීමට ඉක්මන්වීම :

නබි මුහම්මදු (සල්) තුමා පැවැසූ බව සහ්ල් බින් සඃද් (රලි) තුමා මෙසේ වාර්තා කරන්නේය.

عن سهل بن سعد ﷺ قال: قال رسول الله ﷺ: ((لاَ يَزَال النَّاسُ بِخَيْرٍ مَا عَجَّلُـوا الْفِطْرَ)) [متفق عليه]

මිනිසුන් උපවාසය අවසන් කිරීමට උත්සුකවන කාලය පුරාම ඔවුහු යහකමෙහි සිටිති. (බුහාරි හා මුස්ලිම්)

38-රමලාන් රාත්‍රියෙහි සිටගෙන වන්දනාමාන කිරීම :

නබි මුහම්මදු (සල්) තුමා පැවැසූ බව අබූහුරෛරා (රලි) තුමා මෙසේ වාර්තා කරන්නේය.

عن أبي هريرة ﷺ، أن رسول الله ﷺ قال : ((مَنْ قَـامَ رَمَضَـانَ إِيْمَانًـا وَاحْتِسَابًا غُفِرَ لَهُ مَا تَقَدَّمَ مِنْ ذَنْبِهِ)) [متفق عليه]

කවරෙක් හෝ විශ්වාසයෙන් හා පවිත්‍ර චේතනාවෙන් රමලාන් මස (රාත්‍රි)යෙහි නැගිට වන්දනාමාන කරන්නේද, ඔහුගේ පෙර පාපයන් සියල්ල කමා කරනු ලැබේ. (බුහාරි හා මුස්ලිම්)

39-රමලාන් මාසයේ, විශේෂයෙන් අවසන් දින දහයේ ඉ:තිකාෆ් (රැඳී) සිටීම :

ඉබ්නු උමර් (රලි) තුමා මෙසේ වාර්තා කරන්නේය.

عن ابن عمر رضي الله عنهما قال : ((كَانَ رَسُوْلُ اللهِ ﷺ يَعْتَكِفُ الْعَشْرَ الْآوَاخِرَ مِنْ رَمَضَانَ)) [رواه البخاري]

නබි මුහම්මදු (සල්) තුමා රමලාන් මාසයේ අවසන් දින දහයේ (දේවස්ථානයෙහි) රැඳී සිටින්නේය. (බුහාරි)

40-සව්වාල් මාස දින හයක් උපවාසයෙහි යෙදීම :

නබි මුහම්මදු (සල්) තුමා පැවසූ බව අබූ අයියූබ් අල් අන්සාරී (රලි) මෙසේ වාර්තා කරන්නේය.

عن أبي أيوب الأنصاري ﷺ، أن رسول الله ﷺ قال: ((مَنْ صَامَ رَمَضَانَ ، ثُـمَّ أَتْبَعَهُ سِتًا مِنْ شَوَّالٍ ،كَانَ كَصِيَامِ الدَّهْرِ)) [رواه مسلم]

කවරෙක් රමලාන් මාසයේ උපවාසයෙහි යෙදී, පසුව, ෂව්වාල් මාසයේ දින හයක් උපවාසයෙහි යෙදෙන්නේද, ඔහු කාලය පුරාම උපවාසයෙහි යෙදූ අයෙකු ලෙස වන්නේය. (මුස්ලිම්)

41-මාස් පතා දින තුනක් උපවාසයෙහි යෙදීම :

අබූහුරෙරා (රලි) තුමා මෙසේ වාර්තා කරන්නේය.

عن أبي هريرة ﷺ قال: ((أَوْصَانِي خَلِيْلِي بِثَلاَث، لاَ أَدْعُهُنَّ حَتَّى أَمُـوْتَ: صَوْمِ ثَلاَثَةِ أَيَّامٍ مِنْ كُلِّ شَهْرٍ، وَصَلاَةَ الضُّحَى، وَنَوْمٍ عَلَى وِتْرٍ)) [متفق عليه]

නබි මුහම්මදු (සල්) තුමා 'මාස් පතා දින තුනක් උපවා සයෙහි යෙදීම, ලුහා සලාතය ඉටුකිරීම හා විත්ර් සලාතය ඉටුකළ පසු නින්දට යාම' යනාදි කරුණු තුනක් මට අණ කළේය. මා මරණයට පත්වන තෙක් ඒවා අත් නොහරිමි. (බුහාරි හා මුස්ලිම්)

42-අරෆා දින උපවාසය :

නබි මුහම්මිදු (සල්) තුමා පැවැසූ වදනක් අබූ කතාදා (රලි) තුමා මෙසේ වාර්තා කරන්නේය.

عن أبي قتادة ﷺ، أن رسول الله ﷺ قال: ((صِيَامُ يَوْمِ عَرَفَةَ، أَحْتَسِبُ عَلَى اللهِ أَنْ يُكَفِّرَ السَّنَةَ الَّتِيْ قَبْلَهُ، وَالسَّنَةَ الَّتِيْ بَعْدَهُ)) [رواه مسلم]

(දුල්හජ් මස 9 වැනි) අරෆා දින කරන උපවාසය එයට පෙර වසරක හා පසු වසරක කාලයේ පාපයන්ට ප්‍රතිකාර යක් වශයෙන් විය යුතු බව මම අල්ලාහ්ගෙන් අපේක්ෂා කරමි. (මුස්ලිම්)

43-ආෂූරා දින උපවාසය :

නබි මුහම්මිදු (සල්) තුමා පැවැසූ වදනක් අබූ කතාදා (රලි) තුමා මෙසේ වාර්තා කරන්නේය.

عن أبي قتادة ﷺ قال: قال رسول الله ﷺ : ((صِيَامُ يَوْمِ عَاشُوْرَاء ، أَحْتَسِبُ عَلَى اللهِ أَنْ يُكَفِّرَ السَّنَةَ الَّتِي قَبْلَهُ)) [رواه مسلم]

(මුහර්රම් මස දස වැනි) ආෂූරා දින කරන උපවාසය එයට පෙර වසරක හා පසු වසරක කාලයේ පාපයන්ට ප්‍රති කාරයක් වශයෙන් විය යුතු බව මා අල්ලාහ්ගෙන් අපේක්ෂා කරමි. (මුස්ලිම්)

ගමන පිළිබඳ පිළිවෙල

44-ගමනෙහි අමීර් කෙනෙක් පත්කර ගැනීම :

නබි මුහම්මදු (සල්) තුමා පැවසූ බව අබූ සඊද් (රලි) හා අබූහුරෛරා (රලි) තුමා මෙසේ වාර්තා කරන්නෝය.

عن أبي سعيد ، وأبي هريرة رضي الله عنهما قالا: قال رسول الله ﷺ : ((إِذَا خَرَجَ ثَلَاثَةٌ فِي سَفَرٍ فَلْيُؤَمِّرُوا أَحَدَهُمْ)) [رواه أبو داود]

මිනිසුන් තුන් දෙනෙක් ගමනක යෙදෙන කළ මවුන් අතර කෙනෙකු (අමීර්) නායකයා වශයෙන් පත් කරත්වා (අබූදාවූද්)

45-නගින කළ තක්බීරය හා බසින කළ තස්බීහය උසුරීම :

ජාබිර් (රලි) තුමා මෙසේ වාර්තා කරන්නේය.

عن جابر ﷺ قال: ((كُنَّا إِذَا صَعِدْنَا كَبَّرْنَا ، وَإِذَا نَزَلْنَا سَبَّحْنَا)) [رواه البخاري]

අපි උස් බිමක නගින කළ අල්ලාහු අක්බර් යනුවෙන් තක්බීරයද, පහත් බිමක බසින කළ සුබ්හානල්ලාහ් යනු වෙන් තස්බීහයද උසුරා සිටියෙමු. (බුහාරි)

46-කිසියම් තැනක බැසූ කළ :

නබි මුහම්මදු (සල්) තුමාගෙන් තමා සවන් දුන් බව හවලා බින්ත් හකීම් (රලි) තුමිය මෙසේ වාර්තා කරන්නීය.

عن خولة بنت حكيم رضي الله عنها قالت : سمعت رسول الله ﷺ يقـــول :
((مَنْ نَزَلَ مَنْزِلاً ثُمَّ قَالَ: أَعُوْذُ بِكَلِمَاتِ اللهِ التَّامَّاتِ مِنْ شَرِّ مَا خَلَقَ ، لَــمْ يَضُــرُّهُ شَيْءٌ ، حَتَّى يَرْتَحِلَ مِنْ مَنْزِلِه ذَلِكَ)) [رواه مسلم]

කවරෙක් කිසියම් තැනක බැසූ කළ 'අඌදු බිකලිමාතිල් ලාහිත් තාම්මාත් මින් ෂර්රි මා කලක්' යනුවෙන් ප්‍රාර්ථනා කරන්නේද, එතැන් සිට ඔහු ගමන් කරන තෙක් ඔහුට කිසිදු බාධාවක් හෝ නොසිදු වේ. (මුස්ලිම්)

47-ගමන අවසන්කොට පැමිණෙන කළ ප්‍රථමයෙන් දේවස්ථානයට යාම :

කඅබ් ඉබ්නු මාලික් (රලි) තුමා නබි වදනක් මෙලෙස වාර්තා කරන්නේය.

عن كعب بن مالك ﷺ قال: ((كَانَ النَّبِيُّ ﷺ إِذَا قَــدِمَ مِــنْ سَــفَرٍ بَــدَأَ بِالْمَسْجِدِ فَصَلَّى فِيْهِ)) [متفق عليه]

නබි මුහම්මදු (සල්) තුමා යම් ගමනක් අවසන් කොට පැමිණෙන විට ප්‍රථමයෙන් දේවස්ථානයට ගොස් සලාතයක් ඉටු කරන්නේය. (බුහාරි හා මුස්ලිම්)

ආහාර හා ඇඳුම් පිළිබඳ පිළිවෙල

48-නව ඇඳුමක් අඳින කළ :

අබූ සර්ද් අල් කුද්රි (රලි) තුමා නබි වදනක් මෙලෙස වාර්තා කරන්නේය.

عن أبي سعيد الخدري ﷺ قال: كان رسول الله ﷺ إذَا استَجَدَ ثَوْبًا سَـمَّاهُ بِاسْمِه : إمَّا قَمِيْصًا، أَوْ عِمَامَةً، ثُمَّ يَقُوْلُ: ((اَللّٰهُمَّ لَكَ الْحَمْدُ، أَنْتَ كَسَوْتَنِيْه، أَسْأَلُكَ مِنْ خَيْرِه، وَخَيْرِمَاصُنِعَ لَهُ، وَأَعُوْذُ بِكَ مِنْ شَرِّه، وَشَرِّمَا صُنِعَ لَهُ)) [رواه أبو داود]

නබි මුහම්මදු (සල්) තුමාට නව ඇඳුමක් ලැබෙනම් එකී නම කමිසය හෝ තලප්පාව යනුවෙන් කියා පසුව, 'අල්ලා හුම්ම ලකල් හම්දු, අන්ත කසව්තනීහි. අස්අලුක මින් හයි රිහි, ව(ක්)හයිරි මා සුනිඅ ලහු. ව අඌදු බික මින් ෂර්රිහි, ව ෂර්රි මා සුනිඅ ලහු' යනුවෙන් ප්‍රාර්ථනා කරන්නේය. (අබුදාවුද්)

49–පාවහන් මුලින් දකුණින් පැළඳීම :

නබි මුහම්මදු (සල්) තුමා පැවැසූ බව අබූහුරෙරා (රලි) තුමා මෙසේ වාර්තා කරන්නේය.

عن أبي هريرة ﷺ قال: قال رسول الله ﷺ: ((إذَا انْتَعَلَ أَحَدُكُمْ فَلْيَبْدَأْ بِالْيُمْنَى، وَإذَا خَلَعَ فَلْيَبْدَأْ بِالشِّمَال ، وَلْيَنْعَلْهُمَا جَمِيْعًا، أَوْ لِيَخْلَعْهُمَا جَمِيْعًا)) [متفق عليه]

ඔබලාගෙන් කවරෙකු හෝ පාවහන් පළඳින කළ දකුණු පයෙන් ආරම්භ කරන්න. ගලවන කළ වම් පයෙන් ආරම්භ කරන්න. (පළඳින්නේ නම්,) ඒවා දෙකම පළඳින්න. නැති නම්, ඒවා දෙකම ගලවන්න. (බුහාරි හා මුස්ලිම්)

50–ආහාර අනුභව කරන කළ බිස්මිල්ලාහ් කීම :

උමර් බින් අබී සලමා (රලි) තුමා මෙසේ වාර්තා කරයි.

عن عمر بن أبي سلمة ﷺ قال : كُنْتُ فِي حُجْرِ رَسُوْلِ الله ﷺ وَكَانَتْ يَدِيْ تَطِيْشُ فِي الصَّحْفَةِ ، فَقَالَ لِي: ((يَا غُلاَمُ سَمِّ اللهَ، وَكُلْ بِيَمِيْنِكَ، وَكُلْ مِمَّا يَلِيْكَ)) [متفق عليه]

මා නබිනායක මුහම්මදු (සල්) තුමාගේ මඩොක්කුවෙහි හිඳගෙන සිටින කළ මගේ අත (ආහාර) භාජනයෙහි ඇවිදීය. (එය දුටු) නබිනායක තුමා 'දරුවූ, අල්ලාහ්ගේ නාමය උසුරනු. දකුණු අතින් අනුභව කරනු. (භාජනයෙහි) ඔබට සමීපව පවතින තැනින් අනුභව කරනු' යනුවෙන් ප්‍රකාශ කළේය. (බුහාරි හා මුස්ලිම්)

51-ආහාර පාන අනුභව කළ පසු අල්ලාහ්ට ප්‍රශංසා කිරීම :

නබි මුහම්මදු (සල්) තුමා පැවැසූ වදනක් අනස් බින් මාලික් (රලි) තුමා මෙසේ වාර්තා කරන්නේය.

عن أنس بن مالك ﷺ قال: قال رسول الله ﷺ : ((إِنَّ اللهَ لَيَرْضَى عَنِ الْعَبْدِ أَنْ يَأْكُلَ الْأَكْلَةَ فَيَحْمَدَهُ عَلَيْهَا، أَوْ يَشْرَبَ الشَّرْبَةَ فَيَحْمَدَهُ عَلَيْهَا)) [رواه مسلم]

කෙනෙක් ආහාරයක් අනුභව කළ පසු හෝ පානය කළ පසු හෝ ඒවා ලබාදුන් හෙයින් ඔහු අල්ලාහ්ට ප්‍රශංසා කිරීම කෙරෙහි අල්ලාහ් තෘප්ති වන්නේය. (මුස්ලිම්)

52-පානය කිරීම සඳහා හිඳගැනීම :

අනස් (රලි) තුමා නබිතුමාගේ වදනක් මෙලෙස වාර්තා කරන්නේය.

عن أنس ﷺ، عن النبي ﷺ : ((أَنَّهُ نَهَى أَنْ يَشْرَبَ الرَّجُلُ قَائِمًا)) [رواه مسلم]

නබි මුහම්මදු (සල්) තුමා පුද්ගලයෙක් සිටගෙන පානය කිරීම කහනම් කළේය. (මුස්ලිම්)

53-මෝරු පානය කළ පසු කට සේදීම :

ඉබ්නු අබ්බාස් (රලි) තුමා නබි වදනක් මෙසේ වාර්තා කරන්නේය.

عن ابن عباس ﷺ، أَنَّ رَسُوْلَ اللهِ ﷺ شَرِبَ لَبَنًا فَمَضْمَضَ، وَقَالَ: ((إِنَّ لَهُ دَسَمًا)) [متفق عليه]

නබිනායක මුහම්මදු (සල්) තුමා මෝරු පානය කළ පසු කට සේදිය. (පසුව) 'එහි මේදය තිබේ' යනුවෙන් පැවැසීය. (බුහාරි හා මුස්ලිම්)

54-ආහාර විවේචන නොකිරීම :

අබූහුරෛරා (රලි) තුමා මෙසේ වාර්තා කරන්නේය.

عن أبي هريرة ﷺ قال: ((مَا عَابَ رَسُوْلُ اللهِ ﷺ طَعَامًا قَطُّ، كَانَ إِذَا اشْـتَهَاهُ أَكَلَهُ، وَإِنْ كَرِهَهُ تَرَكَهُ)) [متفق عليه]

නබි මුහම්මදු (සල්) තුමා කිසිදු ආහාරයක් විවේචනය නොකරන්නේය. ප්‍රිය කළේනම්, අනුභව කරන්නේය. අප්‍රිය කළේනම්, අනුභව නොකර (ඉවත්ව) සිටින්නේය. (බුහාරි හා මුස්ලිම්)

55-ඇඟිලි තුනෙන් ආහාර අනුභව කිරීම :

කඅබ් බින් මාලික් (රලි) තුමා වදනක් මෙසේ වාර්තා කරන්නේය.

عن كعب بن مالك ﷺ قال: ((كَانَ رَسُوْلُ اللهِ ﷺ يَأْكُلُ بِـثَلَاثِ أَصَـابِعَ، وَيَلْعَقُ يَدَهُ قَبْلَ أَنْ يَمْسَحَهَا)) [رواه مسلم]

නබි මුහම්මදු (සල්) තුමා ඇඟිලි තුනෙන් ආහාර අනු -භව කරන්නේය. පිය දමන්නට පෙර ඒවා උරන්නේය. (මුස්ලිම්)

56-සම්සම් ජලය පානය කිරීම හා එමගින් නිරෝගීභාවය අපේක්ෂා කිරීම :

නබි මුහම්මදු (සල්) තුමා සම්සම් ජලය ගැන මෙසේ පැවැසූ බව අබූදර් (රළි) තුමා වාර්තා කරන්නේය.

عن أبي ذر ﷺ قال: قال رسول الله ﷺ عَنْ مَاءِ زَمْزَمَ: ((إِنَّهَا مُبَارَكَةٌ، إِنَّهَا طَعَامُ طُعْمٍ)) [رواه مسلم] زاد الطيالسي: ((وَشِفَاءُ سُقْمٍ))

එය අභිවෘධිය ලත් දෙයකි. මක්නිසාද සැබැවින්ම, එය විශිෂ්ඨ ආහාරයකි. (මුස්ලිම්) තයාලිසි ග්‍රන්ථයේ 'එය සෑම රෝගයටම නිවාරණයකි' යැයි වාර්තාවේ.

57-රමලාන් අවුරුදු සලාතයට යාමට පෙර යමක් අනුභව කිරීම :

අනස් බින් මාලික් (රළි) තුමා වදනක් මෙලෙස වාර්තා කරන්නේය.

عن أنس بن مالك ﷺ قال : ((كَانَ رَسُوْلُ اللهِ ﷺ لاَ يَغْدُوْ يَوْمَ الْفِطْرِ حَتَّى يَأْكُلَ تَمَرَاتٍ)) وفي رواية: ((وَيَأْكُلُهُنَّ وِتْرًا)) [رواه البخاري]

නබි මුහම්මදු (සල්) තුමා රමලාන් අවුරුදු දිනයෙහි ඉඳි ස්වල්පයක් අනුභව නොකර (සලාතයට) නොයන්නේය. වෙනත් වාර්තාවක 'එතුමා ඉඳි ඔත්තයෙන් අනුභව කරන් නේය' යනුවෙන් සඳහන් වේ. (බුහාරි)

දික්ර් හා ප්‍රාර්ථනා

58-අල්කුර්ආනය වැඩියෙන් පාරායනා කිරීම :

නබි මුහම්මදු (සල්) තුමාගෙන් තමා සවන් දුන් බව අබූ උමාමා අල් බාහිලී (රලි) තුමා වදනක් මෙසේ වාර්තා කරන්නේය.

عن أبي أمامة الباهلي ﷺ قال: سمعت رسول الله ﷺ يقول : ((اقْرَؤُوا الْقُــرْآنَ، فَإِنَّهُ يَأْتِي يَوْمَ الْقِيَامَةِ شَفِيْعًا لأَصْحَابِهِ)) [رواه مسلم]

ඔබලා අල්කුර්ආනය පාරායනා කරන්න. එය පාරායනා කරන්නාට පරමාන්ත දිනයේදී එය (අල්ලාහ් වෙත) රෙකම දාරු කරන්නෙකු ලෙස පැමිණේ. (මුස්ලිම්)

59-අල්කුර්ආනය මිහිරි හඬින් පාරායනා කිරීම :

නබිතුමාගේ අනුගාමික අබූහුරෛරා (රලි) තුමා මෙසේ වාර්තා කරන්නේය.

عن أبي هريرة ﷺ، أنه سمع رسول الله ﷺ يقول: ((ما أَذِنَ اللهُ لِشَيْءٍ مَا أَذِنَ لِنَبِيٍّ حُسْنَ الصَّوْتِ، يَتَغَنَّى بِالْقُرْآنِ يَجْهَرُ بِهِ)) [متفق عليه]

නබිනායක මුහම්මදු (සල්) තුමා අල්කුර්ආනය ශබ්ද නගා මිහිරි හඬින් පාරායනා කිරීම කෙරෙහි අල්ලාහ් සවන් දෙන සේ, වෙනත් කිසිවක් කෙරෙහි හෝ (ප්‍රියභාව යෙන්) ඔහු සවන් නොදෙන්නේය. (බුහාරි හා මුස්ලිම්)

60-සෑම අවස්ථාවෙහිම අල්ලාහ්ව සිහි කිරීම :

ආයිෂා (රලි) තුමිය මෙසේ වාර්තා කරන්නීය.

عن عائشة رضي الله عنها قالت: ((كان رسول الله ﷺ يَذْكُرُ اللهَ عَلَى كُلِّ أَحْيَانِهِ)) [رواه مسلم]

නබි මුහම්මදු (සල්) තුමා සෑම අවස්ථාවෙහිම අල්ලාහ්ව සිහි කරන්නෙකු ලෙස සිටින්නේය. (මුස්ලිම්)

61-තස්බීහ් (අල්ලාහ්ව උත්කෘෂ්ට) කිරීම :

නබිතුමාගේ බිරිඳ ජුවෙරියා (රලි) තුමිය නබිවදනක් මෙසේ වාර්තා කරන්නීය.

عن جويرية رضي الله عنها ، أَنَّ رَسُوْلَ اللهِ ﷺ خَرَجَ مِنْ عِنْدِهَا بُكْــرَةً حِــيْنَ صَلَّى الصُّبْحَ، وَهِيَ فِيْ مَسْجِدِهَا، ثُمَّ رَجَعَ بَعْدَ أَنْ أَضْحَى، وَهِيَ جَالِسَةٌ، فَقَالَ: ((مَــا زِلْتِ عَلَى الْحَالِ الَّتِيْ فَارَقْتُكِ عَلَيْهَا ؟)) قَالَتْ: نَعَمْ، قَالَ النَّبِيُّ ﷺ : ((لَقَدْ قُلْتُ بَعْدَكِ أَرْبَعَ كَلِمَاتٍ، ثَلاَثَ مَرَّاتٍ، لَوْ وُزِنَتْ بِمَا قُلْتِ مُنْذُ الْيَوْمِ لَوَزَنَتْهُنَّ: سُبْحَانَ اللهِ وَبِحَمْدِهِ عَدَدَ خَلْقِهِ، وَرِضَا نَفْسِهِ، وَزِنَةَ عَرْشِهِ، وَمِدَادَ كَلِمَاتِهِ)) [رواه مسلم]

ජුවයිරියා (රලි) තුමිය සමඟ සිටි නබි මුහම්මදු (සල්) තුමා සුබහ් සලාතය ඉටුකළ පසු එතුමියගෙන් සිට පිටත් විය. එතුමිය සලාතය ඉටු කළ ස්ථානයෙහි රැඳී සිටියාය. එතුමා ලුහා (දහවල්) වෙලාවේ ආපසු පැමිණි විටද එතුමිය එම ස්ථානයේත්ම රැඳී සිටීම-දුටු එතුමා 'ඔබෙන් සිට පිටත් වූ සිටම මෙසේම ඔබ රැඳී සිටින්නේද ?' යනුවෙන් විමසීය. එයට එතුමිය 'ඔව්' යැයි කීවාය. පසුව නබිතුමා 'මා ඔබෙන් සිට පිටත්වූ පසු වැකි සතරක් තුන්වරක් පාරායනා කළෙමි.

ඔබ දින පුරාම පාරායනා කළ දෙය කිරා බැලුවෙනම්, මා පාරායනා කළ දේ බරෙන් ඝණව පවතී. එම වැකි සුබ්හා නල්ලාහි වබි හම්දිහි අදද (ක්)හල්කිහි, ව රිළා නෆ්සිහි, ව සිනත අර්ෂිහි, ව මිදාද කලිමාතිහි යන්නෝය' යනුවෙන් පැවැසීය. (මුස්ලිම්)

62-කිඹිසීම :

නබි මුහම්මදු (සල්) තුමා ප්‍රකාශ කළ බව අබූහුරෙරා (රලි) තුමා මෙසේ වාර්තා කරන්නේය.

عن أبي هريرة ﷺ، عن النبي ﷺ قال: ((إِذَا عَطَسَ أَحَدُكُمْ فَلْيَقُلْ: اَلْحَمْـدُ للهِ، وَلْيَقُلْ لَهُ أَخُوْهُ أَوْ صَاحِبُهُ : يَرْحَمَكَ اللهُ. فَإِذَا قَالَ لَهُ: يَرْحَمَـكَ اللهُ، فَلْيَقُـلْ: يَهْدِيْكُمُ اللهُ وَيُصْلِحُ بَالَكُمْ)) [رواه البخاري]

ඔබලාගෙන් කෙනෙකුට කිඹුහුමක් පිටවී නම්, ඔහු 'අල්හම්දු ලිල්ලාහ්' යනුවෙන්ද, (එයට සවන්දෙන) ඔහුගේ සහෝදරයා හෝ මිත්‍රයා 'යර්හමුකල්ලාහ්' යනුවෙන්ද, කිව යුතුයි. එසේ ඔහු 'යර්හමුකල්ලාහ්' යනුවෙන් පැවැසුවෙනම් ඔහු (කිඹුහුම යැවූ තැනැත්තා) 'යහ්දීකුමල්ලාහු වයුස්ලිහු බාලකුම්' යනුවෙන් කිව යුතුයි. (බුහාරි)

63-රෝගියාට ප්‍රාර්ථනා කිරීම :

ඉබ්නු අබ්බාස් (රලි) තුමා නබි වදනක් මෙසේ වාර්තා කරන්නේය.

عن ابن عباس رضي الله عنهما، أَنَّ رَسُوْلَ اللهِ ﷺ دَخَلَ عَلَى رَجُلٍ يَعُوْدُهُ ، فَقَالَ ﷺ: ((لاَ بَأْسَ طَهُوْرٌ، إِنْ شَاءَ اللهُ)) [رواه البخاري]

(රෝගයට පත්) පුද්ගලයෙකුගේ සුවදුක් විමසීමට ගිය නබි මුහම්මදු (සල්) තුමා ඔහුට 'ඔබ කලබල නොවන්න. අල්ලාහ්ගේ මනාපය අනුව සුව ලැබේ' යනුවෙන් පැවැසීය. (බුහාරි)

64-වේදනාව පවතින තැන්හි අත තබා ප්‍රාර්ථනා කිරීම :

උස්මාන් ඉබ්නු අබුල් ආස් (රලි) තුමා මෙලෙස වාර්තා කරන්නේය.

عن عثمان بن أبي العاص ﷺ، أَنَّهُ شَكَا إِلَى رَسُوْلِ اللهِ ﷺ وَجَعًا، يَجِدُهُ فِي جَسَدِهِ مُنْذُ أَسْلَمَ ، فَقَالَ لَهُ رَسُوْلُ اللهِ ﷺ: ((ضَعْ يَدَكَ عَلَى الَّذِيْ يَأْلَمُ مِنْ جَسَدِكَ، وَقُلْ: باسْـمِ اللهِ، ثَلاثًا، وَقُلْ سَبْعَ مَرَّاتٍ: أَعُوْذُ بِاللهِ وَقُدْرَتِهِ مِنْ شَرِّ مَا أَجِدُ وَأُحَاذِرُ)) [رواه مسلم]

තමා ඉස්ලාමය වැළඳ ගත් දින සිට තම ශරීරයෙහි එක්තරා වෙදනාවක් පවතින බව උස්මාන් බින් අබුල් ආස් (රලි) තුමා නබි මුහම්මදු (සල්) තුමාට කීය. එකළ එතුමා 'ඔබේ ශරීරයෙහි වෙදනාව පවතින තැන්හි ඔබේ අත තබා 'බිස්මිල්ලාහ් තුන් වරක්ද, අඌදු බිල්ලාහි වකුද්රතිහි මින් ෂර්රි මා අජිදු වඋහාදිරු යැයි සත් වරක්ද උසුරන්න' යනුවෙන් පැවැසීය. (මුස්ලිම්)

65-කුකුලාගේ හා බූරුවාගේ හැඬලීමට සවන් දෙන කළ :

නබි මුහම්මදු (සල්) තුමා ප්‍රකාශ කළ බව අබූහුරෛරා (රලි) තුමා මෙසේ වාර්තා කරන්නේය.

عن أبي هريرة ﷺ ، أنَّ النَّبِيُّ ﷺ قَالَ: ((إِذَا سَمِعْتُمْ صِيَاحَ الدِّيَكَة فَاسْأَلُوا اللهَ مِنْ فَضْلِه، فَإِنَّهَا رَأَتْ مَلَكًا، وَإِذَا سَمِعْتُم نَهِيْقَ الْحِمَار فَتَعَوَّذُوا بِالله مِنَ الشَّيْطَان، فَإِنَّهَا رَأَتْ شَيْطَانًا)) [متفق عليه]

ඔබලා කුකුලාගේ හැඬලීමට සවන්දුන්නේනම්, අල්ලාහ් ගෙන් ඔහුගේ භාග්‍යය අයදින්න. මන්ද, එය සුරදූතවරයාව දුටුවේය. ඔබලා බූරුවාගේ නප්පුලු හඬට සවන් දුන්නේ නම්, සාතාන්ගේ උවදුරුවන් කෙරෙහි අල්ලාහ්ගෙන් රැකවරණය පතන්න. මන්ද, එය සාතාන්ව දුටුවේය. (බුහාරි හා මුස්ලිම්)

66-වර්ෂාව වසින කළ :

නබිතුමාගේ බිරිඳ ආයිෂා (රළි) තුමිය වදනක් මෙසේ වාර්තා කරන්නීය.

عن عائشة رضي الله عنها ، أَنَّ رَسُوْلَ الله ﷺ كَانَ إِذَا رَأَى الْمَطَـرَ قَـالَ: ((اَللَّهُمَّ صَيِّبًا نَافِعًا)) [رواه البخاري]

නබි මුහම්මදු (සල්) තුමා වර්ෂාව වසින කළ 'ස්වාමිනී. (මෙය) ප්‍රයෝජනවත් වර්ෂාව බවට පත්කරනු මැනව' යනු වෙන් ප්‍රාර්ථනා කරන්නේය. (බුහාරි)

67-නිවසතුල පිවිසෙන කළ :

නබි මුහම්මදු (සල්) තුමාගෙන් තමා සවන් දුන් බව ජාබිර් බින් අබ්දුල්ලාහ් (රළි) තුමා වදනක් මෙසේ වාර්තා කරන්නේය.

عن جابر بن عبدالله ﷺ قال : سمعت النبي ﷺ يقول: ((إِذَا دَخَلَ الرَّجُــلُ بَيْتَهُ فَذَكَرَ اللهَ ــ عَزَّ وَجَلَّ ــ عِنْدَ دُخُوْلِه، وَعِنْدَ طَعَامِه، قَالَ الشَّيْطَانُ: لاَ مَبِيْتَ لَكُمْ وَلاَ عَشَاءَ. وَإِذَا دَخَلَ فَلَمْ يَذْكُرِ اللهَ عِنْدَ دُخُوْلِه، قَالَ الشَّيْطَانُ : أَدْرَكْتُمُ الْمَبِيْــتَ، وَإِذَا لَمْ يَذْكُرِ اللهَ عِنْدَ طَعَامِه، قَالَ : أَدْرَكْتُمُ الْمَبِيْتَ وَالْعَشَاءَ)) [رواه مسلم]

කෙනෙක් සිය නිවසට පිවිසීමට අදහස් කර, පිවිසෙන කළ සහ ආහාර අනුභව කරන කළ අල්ලාහ්ගේ නාමය සිහි කළේනම්, ෂයිතාන් (තම අනුගාමිකයින් අමතා) ‘ඔබ ලාට මෙහි ලැගුම් ගැනීම හෝ ආහාරය හෝ නොමැත’ යනුවෙන් පවසයි. ඔහු පිවිසෙන කළ අල්ලාහ්ගේ නාමය සිහි නොකළේනම්, ෂයිතාන් (ඔවුන් අමතා) ‘ඔබලා ලැගුම් ස්ථානය ලබා ගත්තෝය’ යනුවෙන්ද, ඔහු ආහාර අනුභව කරන කළ අල්ලාහ්ගේ නාමය සිහි නොකළේනම්, ‘ඔබලා ලැගුම් ස්ථානය සහ ආහාරය ලබා ගත්තෝය’ යනුවෙන්ද පවසයි. (මුස්ලිම්)

68-සභාවල අල්ලාහ්ව සිහි කිරීම :

නබි මුහම්මදු (සල්) තුමා ප්‍රකාශ කළ බව අබූහුරෛරා (රලි) තුමා මෙසේ වාර්තා කරන්නේය.

عن أبي هريرة ﷺ، عن النبي ﷺ قال: ((مَا جَلَسَ قَوْمٌ مَجْلِسًا لَمْ يَــذْكُرُوا اللهَ فِيْه، وَلَمْ يُصَلُّوا عَلَى نَبِيِّهِمْ، إِلاَّ كَانَ عَلَيْهِمْ تِرَةٌ (أي: حَسَرَةٌ) فَإِنْ شَاءَ عَذَّبَهُمْ، وَإِنْ شَاءَ غَفَرَ لَهُمْ)) [رواه الترمذي]

පිරිසක් රැස්ව සිටින යම් සභාවක හෝ අල්ලාහ්ගේ නාමය සිහි කිරීම හා ඔවුන්ගේ නබි තුමාට සලවාත් කීම නොසිදුවේනම්, ඔවුන් නින්දාවට ලක්වෙති. අල්ලාහ් කැමැති

නම්, ඔවුන්ට දඬුවම් පමුණුවයි. කැමැතිනම්, ඔවුන්ට කමා කරයි. (තිර්මිද්)

69-වැසිකිළියට පිවිසෙන කළ :

අනස් බින් මාලික් (රලි) තුමා වදනක් මෙසේ වාර්තා කරන්නේය.

عن أنس بن مالك ﷺ قال: كان النبي ﷺ إذَا دَخَلَ (أَيْ: أَرَادَ دُخُوْلَ) الْخَلاَءَ قَالَ: ((اَللّٰهُمَّ إِنِّي أَعُوْذُ بِكَ مِنَ الْخُبُثِ وَالْخَبَائِثِ)) [متفق عليه]

නබි මුහම්මදු (සල්) තුමා වැසිකිළියට යාමට අදහස් කරන කළ 'අල්ලාහුම්ම ඉන්නී අඌදු බික මිනල් ක්හුබුසි වල් ක්හබාඉසි' යනුවෙන් උසුරන්නේය. (බුහාරි හා මුස්ලිම්)

70-සුළිසුළං හමන කළ :

නබිතුමාගේ බිරිඳ ආයිෂා (රලි) තුමිය වදනක් මෙසේ වාර්තා කරන්නීය.

عن عائشة ﷺ قالت: كَانَ النَّبِيُّ ﷺ إذَا عَصَفَت الرِّيْحُ قَالَ: ((اَللّٰهُمَّ إِنِّي أَسْأَلُكَ خَيْرَهَا، وَخَيْرَ مَا فِيْهَا، وَخَيْرَ مَا أُرْسِلَتْ بِهِ، وَأَعُوْذُ بِكَ مِنْ شَرِّهَا، وَشَرِّ مَا فِيْهَا، وَشَرِّ مَا أُرْسِلَتْ بِهِ)) [رواه مسلم]

සුළිසුළං හමන කළ නබිනායක මුහම්මදු (සල්) තුමා 'අල්ලාහුම්ම ඉන්නී අස්අලුක හයිරහා, ක්හයිර මා ෆීහා, වහයිර මා උර්සිල්තු බිහි, වඅඌදු බික මින් ෂර්රිහා, වෂර්රි මා ෆීහා, ව ෂර්රි මා උර්සිල්තු බිහි' යනුවෙන් ප්‍රාර්ථනා කරන්නේය. (මුස්ලිම්)

71-මුස්ලිම්වරුන්ට රහසිගතව ප්‍රාර්ථනා කිරීම :

නබි මුහම්මදු (සල්) තුමාගෙන් තමා සවන්දුන් බව අබූ දර්දා (රලි) තුමා මෙසේ වාර්තා කරන්නේය.

عن أبي الدرداء ﷺ، أنه سمع رسول الله ﷺ يقول: ((مَنْ دَعَا لِأَخِيْهِ بِظَهْرِ الْغَيْبِ، قَالَ الْمَلَكُ الْمُوَكَّلُ بِهِ: آمِيْنَ، وَلَكَ بِمِثْلٍ)) [رواه مسلم]

කවරෙක් හෝ තම සහෝදරයා වෙනුවෙන් රහසිගතව ප්‍රාර්ථනා කළේනම්, එයට අදාල සුරදූතයා 'මෙම ප්‍රාර්ථනාව පිළිගනු මැනව. ඔබටද මෙසේම ලැබෙනු මැනව' යනුවෙන් පවසන්නේය. (මුස්ලිම්)

72-පීඩාවට ලක්වු කළ ප්‍රාර්ථනා කිරීම :

නබි මුහම්මදු (සල්) තුමාගෙන් තමා සවන් දුන් බව උම්මු සලමා (රලි) තුමා මෙසේ වාර්තා කරන්නීය.

عن أم سلمة رضي الله عنها أنها قالت، سمعت رسول الله ﷺ يقول: ((مَا مِن مُسْلِمٍ تُصِيْبُهُ مُصِيْبَةٌ فَيَقُوْلُ مَا أَمَرَهُ اللهُ: إِنَّا للهِ وَإِنَّا إِلَيْهِ رَاجِعُوْنَ، اَللَّهُمَّ أْجُرْنِيْ فِـي مُصِيْبَتِيْ وَأَخْلِفْ لِي خَيْرًا مِنْهَا ــ إِلاَّ أَخْلَفَ اللهُ لَهُ خَيْرًا مِنْهَا)) [رواه مسلم]

කවර මුස්ලිම් වරයෙක් හෝ යම් විපතකට ලක්වී 'එය අල්ලාහ්ගේ අණ පරිදි සිදුවිය. අපි අල්ලාහ් වෙනුවෙන්මය. එමෙන්ම අපි ඔහු වෙතම ආපසු යන්නෙමු. ස්වාමිනී, මෙම විපතෙහි මාහට කුලිය ලබාදෙනු මැනව. මෙම විපතට වඩා ශ්‍රේෂ්ඨයක් ඒ වෙනුවෙන් මාහට ලබා දෙනු මැනව' යනුවෙන් ප්‍රාර්ථනා කළේනම්, අල්ලාහ් ඔහුට එයට වඩා යහපත් දෙයක් ලබා දෙයි. (මුස්ලිම්)

73-සලාමය ව්‍යාප්ත කිරීම :

බර්රාඋ ඉබ්නු ආසිබ් (රලි) තුමා නබි වදනක් මෙසේ වාර්තා කරන්නේය.

عن البَراءِ بن عازب ﷺ قال: ((أَمَرَنَا النَّبِيُّ ﷺ بِسَبْعٍ، وَنَهَانَا عَنْ سَبْعٍ: أَمَرَنَـــا بِعِيَادَةِ الْمَرِيْضِ، ... وَإِفْشَاءِ السَّلَامِ ،... الحديث)) [متفق عليه]

නබි මුහම්මදු (සල්) තුමා අපට කරුණු හතක් අණ කළේය. කරුණු හතක් තහනම් කළේය. රෝගීන්ගේ සුව දුක් බලන ලෙසද, ...ද, සලාමය ව්‍යාප්ත කරන ලෙසද අපට අණ කළේය. (බුහාරි හා මුස්ලිම්)

විවිධ පිළිවෙල

74-දැනුම් ඥානය ලබා ගැනීම :

නබි මුහම්මදු (සල්) තුමා ප්‍රකාශ කළ බව අබූහුරෛරා (රලි) තුමා මෙසේ වාර්තා කරන්නේය.

عن أبي هريرة ﷺ قال: قال رسول الله ﷺ : ((مَنْ سَلَكَ طَرِيْقًا يَلْتَمِسُ فِيْهِ عِلْمًا سَهَّلَ اللهُ لَهُ بِهِ طَرِيْقًا إِلَى الْجَنَّةِ)) [رواه مسلم]

කවරෙක් දැනුම් ඥානය ලබාගැනීමේ මාර්ගයේ ගමන් කරන්නේද, අල්ලාහ් එමගින් ඔහුට ස්වර්ගයට යන මාර්ගය සරල කරයි. (මුස්ලිම්)

75-පිවිසීමට පෙර තුන් වරක් අවසරය පැතීම :

නබි මුහම්මදු (සල්) තුමා පැවසූ බව අබූදර්දා (රලි) තුමා මෙසේ වාර්තා කරන්නේය.

عن أبي موسى الأشعري ﷺ، أَنَّ رَسُوْلَ اللهِ ﷺ قَالَ: ((اَلْإِسْتِئْذَانُ ثَلاَثٌ، فَـإِنْ أُذِنَ لَكَ، وَ إِلاَّ فَارْجِعْ)) [متفق عليه]

(අනුන්ගේ නිවස්වල පිවිසීම වෙනුවෙන්) තුන්වරක් අවසරය පැතිය යුතුයි. ඔබට අවසරය ලැබේනම්, පිවිසෙන්න. නැතිනම්, ආපසු හැරී යන්න. (බුහාරි හා මුස්ලිම්)

76-උපන් ලැබූ දරුවාට රස දෙයක් කැවීම :

අබූමූසා අල් අෂ්අරී (රලි) තුමා වදනක් මෙසේ වාර්තා කරන්නේය.

عن أبي موسى الأشعري ﷺ قال: ((وُلِدَ لِي غُلاَمٌ، فَأَتَيْتُ ﷺ فَسَـمَّاهُ إِبْـرَاهِيْمَ، فَحَنَكَهُ بِتَمَرَةٍ وَدَعَا لَهُ بِالْبَرَكَةِ ... الحديث)) [متفق عليه]

මාහට දරුවෙක් ඉපදිනි. මම එය නබි මුහම්මදු (සල්) තුමාගේ හමුවට රැගෙන ගියෙමි. එතුමා එම දරුවාට ඉබ්රාහීම් යනුවෙන් නමක් තබා (සිය කටෙන්) ඉඳි ගෙඩියක් හපා එය දරුවාට කවා, අභිවෘධිය ලබා දෙන මෙන් එයට ප්‍රාර්ථනා කළේය. (මුස්ලිම්)

77-දරුවා වෙනුවෙන් අකීකා දානය කිරීම :

ආයිෂා (රලි) තුමිය මෙසේ වාර්තා කරන්නීය.

عن عائشة رضي الله عنها قالت : ((أَمَرَنَا رَسُوْلُ اللهِ ﷺ أَنْ نَعُقَّ عَنِ الْجَارِيَـةِ شَاةً، وَعَنِ الْغُلاَمِ شَاتَيْنِ)) [رواه أحمد]

ගැහැනු දරුවා වෙනුවෙන් එළුවෙක් හා පිරිමි දරුවා වෙනුවෙන් එළුවන් දෙදෙනෙක් අකීකා (පිත්) කරන මෙන් නබි මුහම්මදු (සල්) තුමා අපට අණ කළේය. (අහ්මද්)

78-වැහියෙන් තැවරීම සඳහා ශරීරයෙහි සමහර තැන් විවෘතව තැබීම :

අනස් (රලි) තුමා මෙසේ වාර්තා කරන්නේය.

عن أنس ﷺ قال: أَصَابَنَا مَعَ رَسُوْلِ ﷺ مَطَرَ . قَالَ: فَحَسَرَ رَسُـــوْلُ الله ﷺ عَنْ ثَوْبِهِ حَتَّى أَصَابَهُ مِنْ الْمَطَرِ، فَقُلْنَا: يَا رَسُوْلَ اللهِ! لِمَ صَنَعْتَ هَذَا؟ قَالَ: ((لأَنَّـــهُ حَدِيْثُ عَهْدٍ بِرَبِّهِ)) [رواه مسلم]

(දිනක්) අපි නබි මුහම්මදු (සල්) සමග වැස්සට තෙමු තෙමු. එකල එතුමා වැහි ජලය තැවරීම සඳහා සිය ඇඳුම ගැලවීය. එවිට 'අල්ලාහ්ගේ දූතයාණෙනි, ඔබතුමා මෙසේ කළේ කුමක් නිසාද ?' යැයි විමසීමු. එයට නබිතුමා 'මෙය ස්වාමියාගෙන් සිට පහළවන අළුත් දෙයකි' යැයි පැවැසීය. (මුස්ලිම්)

79-රෝගියාගේ සුව දුක් විමසීම :

නබි මුහම්මිදු (සල්) තුමාණන්ගේ වහලෙක්වූ සවබාන් (රලි) තුමා මෙසේ වාර්තා කරන්නේය.

عن ثوبان، مولى رسول الله ﷺ ، عن رسول الله ﷺ قال: ((مَنْ عَادَ مَرِيْضًا ، لَمْ يَزَلْ فِي خُرْفَةِ الْجَنَّةِ)) قِيْلَ : يَارَسُوْلَ اللهِ! وَمَا خُرْفَةُ الْجَنَّةِ ؟ قَالَ: ((جَنَاهَا)) [رواه مسلم]

'කවරෙක් රෝගියෙකුගේ සුව දුක් විමසා බලන්නේද, ඔහු කුර්ෆතුල් ජන්නා හි සිටී' යැයි නබිතුමා පැවැසූ කළ 'කුර්ෆතුල් ජන්නා' යනු කුමක්දැ යි එතුමාගෙන් විමසූහ. එයට එතුමා 'එය පළතුරු උයනකි' යැයි පැවැසූහ. (මුස්ලිම්)

80-මද සිනහවීම :

නබි මුහම්මද් (සල්) තුමා තමාහට පැවැසූ බව අබූදර් (රලි) තුමා මෙසේ වාර්තා කරන්නේය.

عن أبي ذر ﷺ قال: قال لي النبي ﷺ : ((لاَ تَحْقِرَنَّ مِنَ الْمَعْرُوْفِ شَـيْئًا ، وَلَوْ أَنْ تَلْقَى أَخَاكَ بِوَجْهٍ طَلِقٍ)) [رواه مسلم]

ඔබ ඔබේ සහෝදරයාව මුහුණේ ප්‍රසන්නව හමුවීම හෝ වෙවා යම් කුසලක් හෝ නින්දිත ලෙස නොසළකන්න. (මුස්ලිම්)

81-අල්ලාහ් වෙනුවෙන් කෙනෙක් හමුවීම :

නබි මුහම්මද් (සල්) තුමා ප්‍රකාශ කළ බව අබූහුරෛරා (රලි) තුමා මෙසේ වාර්තා කරන්නේය.

عن أبي هريرة ﷺ ، عن النبي ﷺ : ((أَنَّ رَجُلاً زَارَ أَخاً لَهُ فِي قَرْيَةٍ أُخْرَى، فَأَرْصَدَ اللهُ لَهُ عَلَى مُدْرَجَتِه مَلَكًا (أَيْ: أَقْعَدَهُ عَلَى الطَّرِيْقِ يَرْقُبُهُ) فَلَمَّا أَتَى عَلَيْـهِ قَالَ: أَيْنَ تُرِيْدُ ؟ قَالَ: أُرِيْدُ أَخاً لِي فِي هَذِهِ الْقَرْيَةِ. قَالَ: هَلْ لَكَ عَلَيْهِ مِـنْ نِعْمَـةٍ تَرُبُّهَا؟ قَالَ: لاَ، غَيْرَ أَنِّي أَحْبَبْتُهُ فِي اللهِ عَزَّ وَجَلَّ، قَالَ: فَإِنِّي رَسُوْلُ اللهِ إِلَيْكَ، بِأَنَّ اللهَ قَدْ أَحَبَّكَ كَمَا أَحْبَبْتَهُ فِيْهِ)) [رواه مسلم]

පුද්ගලයෙක් වෙනත් ගම්මානයක විසූ සිය සහෝදර යෙකු හමුවීමට ගියේය. ඔහු ගමන් කළ මගෙහි ඔහු රැක බලා ගැනීම සඳහා අල්ලාහ් දූතයෙක් පත් කළේය. ඔහු වෙත පැමිණි එතුමා 'ඔබ කොහි යාමට අදහස් කරන්නේද' යනුවෙන් විමසීය. එයට ඔහු මා මෙම ගම්මානයෙහි වසන මාගේ සහෝදරයෙකු හමුවීමට අදහස් කරමි' යැයි කීය.

'ඔහු ඔබහට කළ උපකාරයට තුති පුදකිරීම පිණිසද ඔබ යන්නේ ?' යනුවෙන් එතුමා විමසීය. එයට ඔහු 'නැත, මා අල්ලාහ් වෙනුවෙන් ඔහු ප්‍රිය කරන්නෙමි' යැයි කීය. එකළ එතුමා 'මා ඔබ වෙත එවනලද අල්ලාහ්ගේ දූතයෙකි. ඔබ අල්ලාහ් වෙනුවෙන් ඔබ සහෝදරයා ප්‍රියකරන සේ අල්ලාහ් ද ඔබ ප්‍රිය කරන්නේය' යනුවෙන් පැවැසීය. (මුස්ලිම්)

82-ආදරය කරන බව දැනුම් දීම :

නබි මුහම්මදු (සල්) තුමා පැවැසූ බව මික්දාම් ඉබ්නු මෑදී කර්බ් (රලි) තුමා මෙසේ වාර්තා කරන්නේය.

عن المقدام بن معدي كرب ﷺ، أنّ النبي ﷺ قال: ((إذَا أَحَبَّ أَحَدُكُمْ أَخَاهُ، فَلْيُعْلِمْهُ أَنَّهُ يُحِبُّهُ)) [رواه أحمد]

ඔබලාගෙන් කෙනෙකු සිය සහෝදරයා ආදරය කරන් නේනම්, ඒ බව ඔහුට දැනුම් දෙන්න. (අහ්මද්)

83-ඇණුම ඇරීම :

නබි මුහම්මදු (සල්) තුමා ප්‍රකාශ කළ බව අබූහුරෛරා (රලි) තුමා මෙසේ වාර්තා කරන්නේය.

عن أبي هريرة ﷺ قال : قال رسول الله ﷺ : ((اَلتَّثَاؤُبُ مِنَ الشَّيْطَانِ، فَإِذَا تَثَاءَبَ أَحَدُكُمْ فَلْيَرُدُّهُ مَااسْتَطَاعَ، فَإِنَّ أَحَدَكُمْ إِذَا قَالَ: هَا، ضَحِكَ الشَّيْطَانُ))

[متفق عليه]

ඇණුම ඇරීම ෂෙයිතාන්ගේ ක්‍රියාවකි. එබැවින්, ඔබලා ගෙන් කවරෙක් හෝ ඇණුම පිට කළේනම්, එය හැකිතාක් වළකින්න. ඔබලාගෙන් කෙනෙක් 'හා' යනුවෙන් ශබ්ද

නගා ඇණුම පිට කළේ නම්, ෂෙයිතාන් සිනහවන්නේය. (මුස්ලිම්)

84–මිනිසුන් හොඳ සිතුවිල්ලෙන් නිගමනය කිරීම :

නබි මුහම්මදු (සල්) තුමා ප්‍රකාශ කළ බව අබූහුරෛරා (රලි) තුමා මෙසේ වාර්තා කරන්නේය.

عن أبي هريرة ﷺ، أنّ رسول الله ﷺ قالَ: ((إِيَّاكُمْ وَالظَّــنَّ، فَــإِنَّ الظَّــنَّ أَكْذَبُ الْحَدِيْث)) [متفق عليه]

(මිනිසුන් කෙරෙහි ඔබලාගේ) දුර් සිතුවිල්ල ගැන මා ඔබලාට අවවාද කරමි. මන්ද, දුර් සිතුවිල්ල ඉතා අසත්‍යම පුවතකි. (බුහාරි හා මුස්ලිම්)

85–නිවසේ කටයුතුවල බිරිඳට සහයවීම :

ආයිෂා (රලි) තුමියගෙන් තමා සවන් දුන් බව අස්වද් (රලි) තුමා මෙසේ වාර්තා කරන්නේය.

عَنِ الْأَسْوَدَ قَالَ: سَأَلْتُ عَائِشَةَ رَضِيَ اللهُ عَنْهَا مَا كَانَ النَّبِيُّ ﷺ يَصْنَعُ فِيْ بَيْتِه ؟ قَالَتْ : ((كَانَ يَكُوْنُ فِيْ مِهْنَة أَهْله (أَيْ : خِدْمَتِهِمْ) ، فَإِذَا حَضَرَت الصَّلَاةُ خَرَجَ إِلَــى الصَّلَاةَ)) [رواه البخاري]

නබි මුහම්මදු (සල්) තුමා නිවසේදී කුමක් කරන්නේද යැයි මම ආයිෂා (රලි) තුමියගෙන් විමසීමි. එයට එතුමිය 'තම බිරිඳන්ට නිවසේ කටයුතුවල සහාය වන්නේය. සලා–තයේ වෙලාව පැමිණි කළ, එය ඉටු කිරීම සඳහා වහාම පිටත්වන්නේය' යනුවෙන් පැවැසූවාය. (බුහාරි)

86-ස්වභාවික සතුටුදායක කාර්යයන් :

නබි මුහම්මදු (සල්) තුමා ප්‍රකාශ කළ බව අබූහුරෙයිරා (රලි) තුමා මෙසේ වාර්තා කරන්නේය.

عن أبي هريرة ﷺ قال: قال رسول الله ﷺ : ((اَلْفِطْرَةُ خَمْسٌ، أَوْ خَمْسٌ مِنَ الْفِطْرَةِ: اَلْخِتَانُ ، وَالْإِسْتِحْدَادُ (حَلْقُ شَعْرِ الْعَانَةِ)، وَنَتْفُ الْإِبْطِ، وَتَقْلِيْمُ الأَظْفَارِ، وَقَصُّ الشَّارِبِ)) [متفق عليه]

සතුටු දායක (සුන්නත්) ස්වභාවික කාර්යයන් පහකි. ඒවා චර්මඡේදනය කිරීම, රහස් අවයවයන්හි මයිල් ඉවත් කිරීම, කිහිල්ල මයිල් ගැලවීම, නියපොතු කැපීම හා උඩු රැවුල කොට කිරීම යනාදීන්ය. (බුහාරි හා මුස්ලිම්)

87-අනාථයන් රැකබලා ගැනීම :

නබි මුහම්මදු (සල්) තුමා පැවැසූ බව සහ්ල් බින් සඃද් (රලි) තුමා මෙසේ වාර්තා කරන්නේය.

عن سهل بن سعد ﷺ، عن النبي ﷺ قال: ((أَنَا وَكَافِلُ الْيَتِيْمِ فِي الْجَنَّةِ هَكَذَا)) . وَقَالَ بِإِصْبَعَيْهِ السَّبَابَةَ وَالْوُسْطَى. [رواه البخاري]

අනාථයන්ට රැකවරනය ලබා දෙන්නා මම හා ස්වර්ගයෙහි මෙසේ සිටිමු යනුවෙන් පවසා තම දබර ඇඟිල්ල හා මැද ඇඟිල්ල (යාකොට) සංඥා කළේය. (බුහාරි)

88-කෝපවීමෙන් වැළකීම :

අබූහුරෙයිරා (රලි) තුමා මෙසේ වාර්තා කරන්නේය.

عن أبي هريرة ﷺ، أَنَّ رَجُلاً قَالَ لِلنَّبِيِّ ﷺ : أَوْصِنِيْ ، قَالَ: ((لاَ تَغْضَبْ)) . فَرَدَدَ مِرَارًا ، قَالَ: ((لاَ تَغْضَبْ)) [رواه البخاري]

පුද්ගලයෙක් නබි මුහම්මදු (සල්) තුමාගෙන් 'මට උප දෙස් දෙන්න' යනුවෙන් විමසීය. එයට එතුමා 'ඔබ කෝප නොවව' යැයි පැවැසීය. ඔහු නැවත නැවත එසේම ඇසීය. එකළද එතුමා 'ඔබ කෝප නොවව' යැයි පැවැසීය. (බුහාරි)

89-අල්ලාහ් කෙරෙහි බියකමින් ඇඩීම :

නබි මුහම්මිදු (සල්) තුමා ප්‍රකාශ කළ බව අබූහුරෙරා (රලි) තුමා මෙසේ වාර්තා කරන්නේය.

عن أبي هريرة ﷺ، عن النبي ﷺ قال: ((سَبْعَةٌ يُظِلُّهُمُ اللهُ فِيْ ظِلِّه، يَوْمَ لاَ ظِلَّ إلاَّ ظِلُّهُ ... وَذَكَر مِنْهُمْ : وَرَجُلٌ ذَكَرَ اللهَ خَالِيًا فَفَاضَتْ عَيْنَاهُ)) [متفق عليه]

අල්ලාහ්ගේ සෙවණැල්ල හැර අන් සෙවණැල්ලක් හෝ නොමැති එම (අවසාන) දිනයෙහි අල්ලාහ් හත් දෙනකුට (පමණක්) තමාගේ සෙවණැල්ල ලබා දෙයි......... තනිවම සිට අල්ලාහ් ගැන සිහි කිරීමෙන් කඳුලු හැලූ මිනිසාද වේ. (බුහාරි හා මුස්ලිම්)

90-නිත්‍ය දානය :

නබි මුහම්මිදු (සල්) තුමා ප්‍රකාශ කළ බව අබූහුරෙරා (රලි) තුමා මෙසේ වාර්තා කරන්නේය.

عن أبي هريرة ﷺ، أن رسول الله ﷺ قال: ((إِذَا مَاتَ الْإِنْسَانُ انْقَطَعَ عَمَلُهُ إِلاَّ مِنْ ثَلاَثِ: إِلاَّ مِنْ صَدَقَةٍ جَارِيَةٍ، أَوْ عِلْمٍ يُنْتَفَعُ بِهِ، أَوْ وَلَدٍ صَالِحٍ يَدْعُوْ لَهُ)) [مسلم]

මිනිසෙක් මරණයට පත්වූ පසු (ඔහුගේ) කාර්ය තුනක් හැර අන් සියල්ල ඔහු වෙතින් ඉවත්වේ. ඒවා ස්ථිරව පවතින දානය හෝ පලදෙන ඥානය හෝ ඔහුට ප්‍රාර්ථනා කරන යහපත් දරුවාය. (මුස්ලිම්)

91-දේවස්ථාන ඉදිකිරීම :

උස්මාන් බින් අෆ්වාන් (රලි) තුමා නබිවදනක් මෙසේ වාර්තා කරන්නේය.

عن عثمان بن عفان ﷺ قَالَ عِنْدَ قَوْلِ النَّاسِ فِيْهِ حِيْنَ بَنَى مَسْجِدَ رَسُوْلِ اللهِ ﷺ : إِنَّكُمْ أَكْثَرْتُمْ وَإِنِّي سَمِعْتُ النَّبِيَّ ﷺ يَقُوْلُ: ((مَنْ بَنَى مَسْجِدًا ـ قال بُكير: حسبت أنه قال: يَبْتَغِي بِهِ وَجْهَ اللهِ ـ بَنَى اللهُ لَهُ مِثْلَهُ فِي الْجَنَّةِ)) [متفق عليه]

උස්මාන් (රලි) තුමා නබි මුහම්මදු (සල්) තුමාගේ දේවස් -ථානය ප්‍රතිසංස්කරණය කළ අවස්ථාවේ මිනිසුන් එතුමා ගැන නොයෙක් දේ කථා කළහ. එකළ (උස්මාන් (රලි) තුමා මවුන් අමතා) ඔබලා මා ගැන බොහෝ දේ කථා කළ හුය. 'කවරෙක් අල්ලාහ් වෙනුවෙන් යතු පිරිසිදු චේතනා වෙන් දේවස්ථානයක් ඉදිකරන්නේද, අල්ලාහ් ඔහුට එසේම එකක් ස්වර්ගයෙහි ඉදිකරයි' යැයි නබිතුමා කළ ප්‍රකාශ යක් තමා සවන් දුන් බව පැවැසීය. (බුහාරි හා මුස්ලිම්)

92-මිළදී ගැනීමේ හා විකිණීමේදී ඉවසිල්ලෙන් හැසිරීම :

නබි මුහම්මදු (සල්) තුමා පැවැසූ බව ජාබිර් බින් අබ් දුල්ලාහ් (රලි) තුමා මෙසේ වාර්තා කරන්නේය.

عن جابر بن عبدالله رضي الله عنهما، أن رسول الله ﷺ قال: ((رَحِمَ اللهُ رَجُلاً سَمْحًا إِذَا بَاعَ ، وَ إِذَا اشْتَرَى ، وَإِذَا اقْتَضَى)) [رواه البخاري]

දෙයක් මිළදී ගැනීමේදීද, විකිණීමේදීද හා යම් අයිතිවාසි කමක් අයැදීමේදී ඉවසිල්ලෙන් හැසිරෙන මිනිසාට අල්ලාහ් ගේ කරුණාව පහළ වේවා. (බුහාරි හා මුස්ලිම්)

93-මාර්ගයෙහි අවහිරව පවතින දේ ඉවත් කිරීම :

නබි මුහම්මදු (සල්) තුමා ප්‍රකාශ කළ බව අබූහුරෛරා (රලි) තුමා මෙසේ වාර්තා කරන්නේය.

عن أبي هريرة ﷺ، أن رسول الله ﷺ قال: ((بَيْنَمَا رَجُلٌ يَمْشِي بِطَرِيْقٍ ، وَجَـدَ غُصْنَ شَوْكٍ عَلَى الطَّرِيْقِ، فَأَخَّرَهُ، فَشَكَرَ اللهُ لَهُ ، فَغَفَرَ لَهُ)) [رواه مسلم]

අප අතර සිටින කෙනෙක් මාර්ගයේ ගමන් කරන කළ එහි කටු සහිත අත්තක් දැක, එය ඉවත් කළේ නම්, අල්ලාහ් ඔහුට තුති පුදකොට ඔහුගේ පාපයන් කමා කරයි. (මුස්ලිම්)

94-සදකාව :

නබි මුහම්මදු (සල්) තුමා ප්‍රකාශ කළ බව අබූහුරෛරා (රලි) තුමා මෙසේ වාර්තා කරන්නේය.

عن أبي هريرة ﷺ قال ، قال رسول الله ﷺ : ((مَنْ تَصَدَّقَ بِعَدْلِ تَمَرَةٍ مِنْ كَسْبٍ طَيِّبٍ، وَلاَ يَقْبَلُ اللهُ إِلاَّ الطَّيِّبَ، فَإِنَّ اللهَ يَتَقَبَّلُهَا بِيَمِيْنِهِ ، ثُمَّ يُرَبِّيْهَا لِصَـاحِبِهِ كَمَا يُرَبِّي أَحَدُكُمْ فَلُوَّهُ حَتَّى تَكُوْنَ مِثْلَ الْجَبَلِ)) [متفق عليه]

අල්ලාහ් පවිත්‍ර දේ හැර අන් කිසිවක් හෝ පිළි නොගනී. කවරෙක් පවිත්‍ර ජීවනෝපායෙන් ඉඳි ප්‍රමාණයක් සදකා (දානය) කළේද, සැබැවින්ම, අල්ලාහ් එය පිළිගනී. පසුව, ඔබලා අශ්ව නාම්බෙක් (කවා පොවා) වර්ධනය කරන සේ ඔහුට එය කන්දක ප්‍රමාණය තෙක් වර්ධනය කරයි. (බුහාරි හා මුස්ලිම්)

95-හජ් මස දින දහයෙහි අධිකව යහකම් කිරීම :

නබි මුහම්මදු (සල්) තුමා පැවැසූ බව ඉබ්නු අබ්බාස් (රලි) තුමා මෙසේ වාර්තා කරන්නේය.

عن بن عباس ﷺ ، عن النبي ﷺ، أنه قال: ((مَا الْعَمَلُ فِي أَيَّامٍ أَفْضَلَ مِنْهَا فِي هَذِهِ (يَعْنِي أَيَّامَ الْعَشْرِ))) قَالُوا: وَلاَ الْجِهَادُ ؟ قَالَ: ((وَلاَ الْجِهَادُ ، إِلاَّ رَجُلٌ خَرَجَ يُخَاطِرُ بِنَفْسِهِ وَمَالِهِ فَلَمْ يَرْجِعْ بِشَيْءٍ)) [رواه البخاري]

වෙනත් දිනවල කරන කුමණ යහකමක් හෝ මෙම (දුල් හජ්) දින (දහ)යෙහි කරන යහකමට වඩා ශ්‍රේෂ්ඨත්වයෙන් නොපවතී. (බුහාරි)

96-හුණා මැරීම :

නබි මුහම්මදු (සල්) තුමා ප්‍රකාශ කළ බව අබූහුරෙරා (රලි) තුමා මෙසේ වාර්තා කරන්නේය.

عن أبي هريرة ﷺ قال: قال رسول الله ﷺ : ((مَنْ قَتَلَ وَزْغًا فِيْ أَوَّلِ ضَرْبَةٍ كُتِبَتْ لَهُ مِئَةَ حَسَنَةٍ، وَفِيْ الثَّانِيَةِ دُوْنَ ذَلِكَ ، وَفِي الثَّالِثَةِ دُوْنَ ذَلِكَ)) [رواه مسلم]

එකම පහරකින් හුණෙක් ඝාතනය කරන්නාට කුසල් සියයක්ද, පහර දෙකකින් ඝාතනය කරන්නාට එයට අඩු වෙන්ද, පහර තුනකින් ඝාතනය කරන්නාට එයටත් අඩු වෙන්ද ලැබේ. (මුස්ලිම්)

97-තමා සවන් දෙන සෑම දේ අන් අයට නොකීම :

නබි මුහම්මදු (සල්) තුමා පැවැසූ වදනක් හෆ්ස් බින් හාසිම් (රලි) තුමා මෙසේ වාර්තා කරන්නේය.

عن حفص بن عاصم ﷺ قال: قال رسول الله ﷺ : ((كَفَى بِالْمَرْءِ إِثْمًا أَنْ يُحَدِّثَ بِكُلِّ مَا سَمِعَ)) [رواه مسلم]

කෙනෙකු තමා සවන් දෙන සෑම දේ අන් අයට පැවැසීම ඔහුට පාප සිදුවීමට ප්‍රමාණවත්වේ. (මුස්ලිම්)

98-කුලිය ලැබෙන චේතනාවෙන් පවුලේ අයට වියදම් කිරීම :

නබි මුහම්මදු (සල්) තුමා පැවැසූ බව අබූ මස්ඌද් අල් බද්රී (රලි) තුමා මෙසේ වාර්තා කරන්නේය.

عن أبي مسعود البدري ﷺ، عن النبي ﷺ قال: ((إِنَّ الْمُسْلِمَ إِذَا أَنْفَقَ عَلَى أَهْلِهِ نَفَقَةً، وَهُوَ يَحْتَسِبُهَا، كَانَتْ لَهُ صَدَقَةً)) [رواه مسلم]

මුස්ලිම් වරයෙක් පින් ලබන චේතනාවෙන් සිය පවුලේ අයට වියදම් කලේනම්, එය සදකා හෙවත් දානයක් බවට පත්වේ. (මුස්ලිම්)

99-කඅබාව වේගයෙන් සක්මන් කිරීම :

ඉබ්නු උමර් (රලි) තුමා නබි වදනක් මෙලෙස වාර්තා කරන්නේය.

عن ابن عمر رضي الله عنهما قال: ((كَانَ رَسُوْلُ اللهِ ﷺ إِذَا طَافَ الطَّوَافَ الأَوَّلَ، خَبَّ (أي : رَمَلَ) ثَلاثًا وَمَشَى أَرْبَعًا ... الحديث)) [متفق عليه]

නබි මුහම්මදු (සල්) තුමා ප්‍රථම තවාෆය (ප්‍රදක්ෂිණා) කරන කළ පළමු තුන් වටය වේගයෙන්ද ඉතිරි වට සතර සාමාන්‍යයෙන්ද ගමන් කරන්නේය. (බුහාරි හා මුස්ලිම්)

100-සුළු වශයෙන් හෝ යහකම් අඛණ්ඩව කිරීම :

ආයිෂා (රලි) තුමිය මෙසේ වාර්තා කරන්නීය.

عن عائشة رضي الله عنها، أنها قالت: سُئِلَ رَسُوْلُ اللهِ ﷺ: أَيُّ الْأَعْمَالِ أَحَبُّ إِلَى اللهِ ؟ قَالَ : ((أَدْوَمُهَا وَإِنْ قَلَّ)) [متفق عليه]

අල්ලාහ් වෙත ඉතාම ප්‍රිය කරන ක්‍රියාව කුමක්ද යැයි නබි මුහම්මදු (සල්) තුමාගෙන් විමසූ කළ එතුමා 'එය සුළු වෙන් හෝ අඛණ්ඩව කරන ක්‍රියාවකි' යනුවෙන් පැවැසීය. (බුහාරි හා මුස්ලිම්)

وصلى الله وسلم وبارك على نبينا محمد وآله وصحبه أجمعين

والحمد لله رب العالمين

محتويات -- ١٠٠ سنة ثابتة

නබිතුමාගේ මදුර දේශනා 100

පටුන

විෂය **පිටුව**

1-නින්දයෙහි පිළිවෙල .... - 4

2-දෝවනය හා සලාතයෙහි පිළිවෙල .... - 7

3-උපවාසය පිළිබඳ පිළිවෙල .... - 23

4-ගමන පිළිබඳ පිළිවෙල .... - 27

5-ආහාර හා ඇඳුම් පිළිබඳ පිළිවෙල ...... - 28

6-දික්ර් හා ප්‍රාර්ථනා .... - 33

7-විවිධ පිළිවෙල් .... - 41